# දූ දරුවන් සඳහා නබි වදන් හතළිහක්

## (අල් අර්බඌන් අල් විල්දානියියා)

මුහම්මද් බින් සුලයිමාන් අල් මුහන්නා



# දූ දරුවන් සඳහා නබි වදන් හතළිහක්

## (අල් අර්බඋාන් අල් විල්දානියියා)

මුහම්මද් බින් සුලයිමාන් අල් මුහන්නා

ⓒ جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة ، 1445هـ

المهنا ، محمد بن سليمان
الأربعون الولدانية: أربعون حديثاً صحيحاً مع شرحها باللغة السنهالية. / محمد بن سليمان المهنا ؛ مركز أصول - ط1. .- الرياض ، 1445هـ

رقم الإيداع: 1445/19264
ردمك: 978-603-8438-08-4

مركز أصول
Osoul Center
www.osoulcenter.com

මෙම පොත උසුල් මධ්‍යස්ථානය විසින් සංස්කරණය කොට ඇත. පහත සඳහන් කොන්දේසි දෙක මත ඕනෑම අයුරින් මෙම පොත නැවත ප්‍රකාශයට පත් කිරීමට අවසර ඇත.1: මෙම මධ්‍යස්ථානයෙහි අවසරය හා පිළිගැනීම සියලු සංස්කරණ මත පැහැදිලිව සඳහන් විය යුතුයි. 2: මෙම මධ්‍යස්ථානය වෙත යොමු නොකොට කිසිදු වෙනසක් හෝ සංශෝධනයක් කිරීමට නොහැක. මෙම පොත නැවත මුද්‍රණය කිරීමේදී උසස් ප්‍රමිතිය පවත්වා ගැනීමට මධ්‍යස්ථානය දැඩි ලෙස නිර්දේශ කරයි.

+966 11 445 4900
+966 11 497 0126
P.O.BOX 29465 Riyadh 11457
www.osoulcenter.com

بسم الله الرحمن الرحيم

# පෙරවදන

සියලු පැසසුම් සකල ලෝහි අධිපතියාණන් වූ අල්ලාහ්ට ම හිමි ය. ශාන්තිය හා සමාදානය ධර්ම දූතයාණන් හටත් එතුමාගේ පවුලේ ඥාතී හිතමිතුරන් ඇතුළු සියලු දනන් හටත් අත් වේවා!

හතළිහ යන සංඛ්‍යාව පදනම් කර ගනිමින් බොහෝ කෘතින් විද්වතුන් විසින් සම්පාදනය කොට ඇත. ඒවා අතරින් (අල් අර්බඋෘන් අන් නවවියියාහ්) නොහොත් නබි වදන් හතළිහ නම් කෘතිය සුප්‍රකටය. ධර්මය හදාරන සිසුන් එම නබි වදන් පාඩම් කිරීම සහ ඒවායෙහි අර්ථය නිසි ලෙස අවබෝධ කර ගැනීම යන අරමුණු මුල් කර ගනිමින් ඉමාම් අන් නවවිතුමා විසින් එය සම්පාදනය කරන ලදී.

පහත සඳහන් කෘතීන් නබි වදන් හතළිහක් පදනම් කර ගනිමින් සම්පාදනය කෙරුණු කෘතීන් වේ.

- හර්වීතුමාගේ අල් අර්බඋෘන් ෆී දලාඉලිත් තව්හීද්
- ඉබ්නු මුෆල්ළල්තුමාගේ අල් අර්බඊන් අල් ඉලාහියියා
- ඉබ්නු අසාකිර්තුමාගේ අල් අර්බඊන් අල් බුල්දානියියා
- හා වෙනත් බොහෝ කෘතීන් තිබේ.

අල්ලාහ්ගේ දයාව හේතුවෙන් කෙටි නබි වදන් හතළිහක් එකතු කිරීමේ භාග්‍ය මටද හිමි විය. අපේ දූ දරුවන් ඒවා පාඩම් කර ඒවා නිසි ලෙස අවබෝධ කර ගැනීමට හැකි වන අයුරින් නොයෙකුත් ආගමික මාතෘකාවන් යටතේ සම්පාදනය කොට මෙම කෘතියට **'දූ දරුවන් සඳහා නබි වදන් හතළිහක්'** යන නම ද තැබුවෙමි. මෙම කෘතිය සම්පාදනය කෙරී ඇත්තේ කුඩා දූ දරුවන් මුල් කරගෙන බැවින් එසේ නම් කිරීමට මම පෙළඹුණෙමි.

මෙහි සඳහන් සියලු නබි වදන් සහීහ් හෙවත් නිරවද්‍යතාව තහවුරු කරන ලද බුහාරි හා මුස්ලිම් යන ග්‍රන්ථ දෙකෙහි හෝ ඉන් එකක හෝ සඳහන් නබි වදන් වීම විශේෂයි.

මෙම කෘතියෙහි සඳහන් සෑම නබි වදනකට ම ඒවායෙහි අර්ථය නිවැරැදි ව අවබෝධ කර ගැනීම සඳහා, හැකි අයුරින් පැහැදිලි ව හා සරල ව අර්ථ විවරණ ද ඉදිරිපත් කොට ඇත්තෙමි.

මෙම සේවය අල්ලාහ් යහපත් අයුරින් පිළිගෙන මෙම නබි වදන් පාඩම් කිරීම, ඒවා හැදෑරීම, ඒවා තනි ව හෝ කණ්ඩායම් වශයෙන් කියවීම, නිවෙස්, පාසැල් හා දේවස්ථාන වල ඒ සම්බන්ධයෙන් තරඟ හා පාඨමාලා පැවැත්වීම යනාදී ක්‍රියාකාරකම් මඟින් ජනයා අතර ද එය පිළිගැනීමට ලක් විය යුතුයි යන්න මාගේ ඉමහත් අපේක්ෂාවයි.

අහෝ පරමාධිපතියාණනි! අප කළ දෑ පිළිගනු මැනව! සැබැවින්ම ඔබ සර්ව ශ්‍රාවකය; සර්ව ඥානී ය. තවද අපගේ පාපයන් සඳහා සමාව ලබා දෙනු මැනව! සැබැවින්ම ඔබ සමාව දෙන්නාය; කරුණාවන්තය. අප ව, අපගේ දෙමාපියන්, අපගේ හිතවතුන් හා සියලු මුස්ලිම්වරුන් ව කමා කරනු මැනව! අපගේ ධර්ම දූතයාණන් කෙරෙහිත් එතුමාගේ පවුල් ඥාතීන් හිතමිතුරන් ඇතුළු සියලු දනන් හටත් ඔබේ ශාන්තිය හා සමාදානය අත් වේවා!

**මුහම්මද් බින් සුලයිමාන්**

**අල් මුහන්නා**

**රියාද් නුවර/ සවුදි අරාබියා**

00966505490525

Twitter: @almohannam

E-mail: almohanna.m@gmail.com

# මේ කෘතිය පිළිබද මාර්ගෝපදේශ හයක්

1. මෙම කෘතිය දරුවන් සඳහා සුදුසු වන සේම වැඩිහිටියන්ටත් සුදුසුයි. මෙම කෘතියෙහි අල් කුර්ආන් වැකි, නබි වදන් සහ විද්වතුන්ගේ පොත් වල සඳහන් මාර්ගෝපදේශ -එහි මුල් ප්‍රකාශ සමඟ හෝ එහි අර්ථය හෝ ගෙන හැර දැක්වීම- මිස වෙනකක් අන්තර්ගත වී නැත.

2. මෙම කෙටි නබි වදන් මා විසින් තෝරා ගැනීමට හේතුවූයේ ඒවා පාඩම් කිරීමේ දී පහසු වන බැවිණි. එමෙන්ම විවිධ මාතෘකාවන් යටතේ ඒවා සඳහන් කර ඇත්තේ උපරිම අයුරින් ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ය.

3. පාඩම් කිරීමට සහ නැවත ආවර්ජනය කිරීමට පහසු වන අන්දමින් නබි වදන් හතළිහ ම මෙම කෘතිය අවසානයේ දී මා විසින් පිළිවලට ගෙන එන ලදී.

4 කුඩා දූ දරුවන් පාඩම් කිරීම සඳහා මෙම නබි වදන් හතළිහ මා සම්පාදනය කළෙමි. එබැවින් නිවෙස්, පාසැල්, දේවස්ථාන හා වෙනත් උචිත ස්ථාන වල මෙම නබි වදන් පාඩම් කිරීමේ තරඟ හා වැඩසටහන් පවත්වන ලෙස මා උපදෙස් දෙමි.

5 මෙම නබි වදන් පාඩම් කිරීමේ දී දරුවන්ට ලෙහෙසි වීමටත් එයින් උපුටා ගත් ප්‍රයෝජනවත් ඉස්ලාමීය කරුණු ඔවුනට උගන්වීමටත් දෙමාපියන් හා ගුරුවරුන් විසින් ඔවුනට එය ප්‍රථමයෙන් කියවා පෙන්වන ලෙස ඉල්ලා සිටිමි.

6 එම නබි වදන් විග්‍රහ කිරිමේ දී බෝහෝ අර්ථ දැක්වීම්, උපුටාගැනීම් හා මාර්ගෝපදේශ රාශියක් ඉදිරිපත් කර ඇත්තෙමි. එහෙත් මා මෙහි ඉදිරිපත් කළ කරුණු වලට වඩා බොහෝ කරුණු ඉන් බාහිර ව දක්නට ලැබේ. එබැවින් තනිවම හෝ වෙනත් කෙනෙකුගේ සහය ඇතිව හෝ මෙම නබි වදන් පිළිබඳ කරුණු සොයා බලා ඒවායින් ප්‍රයෝජන ලබා ගෙන අන් අයටත් ඒ ප්‍රයෝජනය ලබා දීම සඳහා ඒවා විශ්ලේශණය කර බලන මෙන් මා දූ දරුවන්ගෙන් ඉල්ලා සිටිමි.

# 1

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඉස්ලාම් දහම කරුණු පහක් මත පිහිටා ඇත. ඒවා වනාහි: නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවකු නොමැති බවත් මුහම්මද්තුමාණෝ අල්ලාහ්ගේ අවසන් ධර්ම දූතයාණන් බවත් සාක්ෂි දැරීම, සලාතය ස්ථාපිත කිරීම, සකාතය පිරිනැමීම, හජ් කර්තව්‍යය ඉටු කිරීම සහ රමළාන් මසෙහි උපවාසයේ නියැලීම වේ."** (මූලාශ්‍ර: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

මෙම හදීසයේ, ඉස්ලාම් දහමෙහි අනිවාර්ය කර්තව්‍යයන් සහ වැදගත්ම වගකීම් පහක් ඇති බව නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා අපට පැහැදිලි කර ඇත. ඒවා හඳුන්වනු ලබන්නේ **"අර්කානුල් ඉස්ලාම්"** නොහොත් **"ඉස්ලාම්හි කුළුණු"** ලෙසයි.

**පළමු කුළුණ:** අල්ලාහ් හැර නැමදුමට සුදුසු වෙනත් දෙවියෙකු නොමැති බවටත්, මුහම්මද් තුමාණන් ඔහුගේ ධර්ම දූතයා බවටත් සාක්ෂි දැරීම වේ. මෙය අනෙකුත් කුළුණු අතරින් ප්‍රධානතම කුළුණ වේ. සාක්ෂියේ මෙම ප්‍රකාශය කවරෙකු ඔහුගේ මුවින් පවසා ඔහුගේ සිතෙන් එය විශ්වාස කරන්නේ ද ඔහු ඉස්ලාම් දහමට ඇතුළු වේ.

**දෙවන කුළුණ:** සලාතය ස්ථාපිත කිරීම; සලාතය ඉස්ලාමයේ කුළුණු අතරින් (සාක්ෂි දෙකෙන් පසුව) ශ්‍රේෂ්ඨතම කුළුණයි. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ ඊට පසු එය සඳහන් කළේ එබැවිනි.


**තෙවන කුළුණ:** සකාත්; සකාත් යනු ඉස්ලාමීය නීතිය මගින් නිර්දේශ කර ඇති මුදල් ප්‍රමාණයකි. එය මුස්ලිම්වරයෙකු විසින් දුප්පතුන්ට,

අසරණයින්ට සහ ඒ සඳහා සුදුසුකම් ඇති අයහට ලබා දිය යුතු ය.

**සිව්වන කුළුණ:** රමළාන් හි උපවාසය; ඉස්ලාම් දහම අනුමත කළ හේතුවක් නොමැති නම් මුස්ලිම්වරයෙකු රමළාන් මාසය පුරාම උපවාසයේ නිරත විය යුතුයි.

**පස්වන කුළුණ:** හජ් වන්දනාව; එය ඉටු කිරීමට හැකියාව ඇති අය සඳහා ජීවිතයේ එක් වරක් අනිවාර්ය වේ.

ඉස්ලාම් දහම ගොඩනැගී ඇති කුළුණු පහ මෙය වන අතර ඒ කුළුණු වල නීතිරීති සහ ආචාර විධි පිළිබඳ විස්තර ඉස්ලාමීය නීති විද්‍යා පොත්වල සඳහන් වේ.



# 2

**අනස් බින් මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගෙන් මහා පාපයන් පිළිබඳ විමසන ලදී. එවිට: "අල්ලාහ්ට ආදේශ තැබීම, දෙමාපියන්ට අකීකරු වීම, ආත්මයක් ඝාතනය කිරීම සහ බොරු සාක්ෂි දීම වේ" යනුවෙන් එතුමා ප්‍රකාශ කළහ.** (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්).

## විවරණය

මෙම හදීසයේ නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා අපට මහා පාපයන් සහ බරපතල වැරදි ලෙස සැලකෙන කරුණු සතරක් පිළිබඳ අවවාද කර ඇත. මෙම හදීසයේ සඳහන් වන මහා පාප සතර වනාහි:

(1) **පළමු පාපය:** අල්ලාහ් සමග දේව හවුල්කරුවන් පත් කිරීම නොහොත් අල්ලාහ්ට ආදේශ තැබීම. මන්ද අල්ලාහ්ට ආදේශ තැබීම මුස්ලිම්වරයෙකු ඉස්ලාමයෙන් බැහැර කරන අතර ම ඔහුව දේවත්වය ප්‍රතික්ෂේප කිරීම වෙත ගෙන යනු ඇත. එමෙන්ම සර්වබලධාරියාණෝ පවසන පරිදි එය නිරයේ සදාකාලිකත්වයට ද හේතුවක් වේ. **"නියත වශයෙන්ම අල්ලාහ් මර්යම්ගේ පුත් මසීහ් යැයි පැවසූ අය ප්‍රතික්ෂේපකයින් බවට පත් වූහ. ඉස්රාඊල් දරුවනි! මාගේ පරමාධිපති ද නුඹලාගේ පරමාධිපති ද වන අල්ලාහ්ට නුඹලා නැමදුම් කරනු යැයි මසීහ් පැවසුවේය. සැබැ කරුණ නම් කවරෙකු අල්ලාහ්ට ආදේශ තබන්නේ ද එවිට අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කළේය. තවද ඔහු ලැගුම් ගන්නා ස්ථානය නිරය වේ. අපරාධකරුවන්ට උදව් කරන්නන් කිසිවකු නොමැත."** (අල් මාඉදා 72)

(2) **දෙවන පාපය:** දෙමාපියන්ට අකීකරු වීම. ඔවුන් අත්හැර දැමීම, ඔවුන් සමඟ වන සම්බන්ධතා විසන්ධි කිරීම, වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ ඔවුන් රිදවීම මෙන්ම ඔවුනට අවනත නොවීම සහ විවිධ ආකාරයේ හිංසාවන් මගින් ඔවුනට හිංසා කිරීම යනාදී කරුණු එයට ඇතුළත් වේ.

(3) **තෙවන පාපය:** ආත්මයක් ඝාතනය කිරීම. පිවිතුරු ආත්මයක් ඝාතනය කිරීම මහා පාපයකි. එය දෙවිඳාණන්ගේ උදහසට සහ කෝපයට හේතුවක් වන අතර නිරයට ඇතුළු වීමට ද එය හේතුවක් වනු ඇත. දෙවිඳාණෝ මෙසේ ප්‍රකාශ කරති: **"කවරෙකු දේවත්වය විශ්වාස කරන්නෙකු ව උවමනාවෙන් ඝාතනය කරන්නේ ද එවිට ඔහුගේ ප්‍රතිඵලය නිරය වේ. එහි ඔහු සදාතනිකයකු වේ. තවද අල්ලාහ් ඔහු කෙරෙහි කෝප වෙයි. තවද ඔහුට ශාප කරයි. තවද ඔහු වෙනුවෙන් අතිමහත් දඬුවමක් පිළියෙල කරයි."** (අන් නිසාඃ 93)

(4) **සිව්වන පාපය:** බොරු සාක්ෂි ලබා දීම. කිසියම් කෙනෙකු කෙනෙකුට විරුද්ධව බොරු සාක්ෂි ලබා දෙන්නේ ද ඔහු හෙළා දකිනු ලබන අවලාදයක් සහ විශාල පාපයක් සිදු කරන්නෙකි.

මුස්ලිම්වරයකු සෑම අවස්ථාවකම, සෑම තත්ත්වයකම සත්‍යවාදී වීම අනිවාර්ය වන අතර, එයින්: සාක්ෂි දීමේදී අවංක වීම ද එක් මුඛ්‍ය කරුණකි. විනිසුරුවරයකු අබියස හෝ වෙනත් කෙනෙකු අබියස හෝ යම් දෙයකට සාක්ෂි දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටිනු ලබන කල්හි ඔහු සත්‍යයට සහ යථාර්ථයට සාක්ෂි ලබා දිය යුතු අතර, මහා පාපයකට ඇද වැටීමෙන් වැළකී සිටීමට නම් බොරු සාක්ෂි ලබා දීමෙන් සහ අසත්‍ය පැවසීමෙන් ඔහු වැළකී සිටිය යුතුය.

# 3

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "(සැබෑ) මුස්ලිම්වරයකු වනාහි කවරෙකුගේ දිවෙන් හා අතින් (සිදු කරන හිරිහැර වලින්) අනෙකුත් මුස්ලිම්වරු ආරක්ෂාව ලැබුවේ ද ඔහු වේ." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

පොදුවේ ගත් කල, ඉස්ලාම් දහම සමඟ ඉතා දැඩි ලෙස ඇල්මක් ඇති මුස්ලිම්වරු මෙන්ම ඒ සමඟ දුර්වල සබඳතාවක් ඇති මුස්ලිම්වරු ද සිටිය හැක. එසේම, මුස්ලිම්වරයෙකුගේ දේව විශ්වාසය ද ශක්තිමත් හෝ දුර්වල විය හැක.

ඉස්ලාමයේ ශක්තිය මගින් සහ එහි පරිපූර්ණත්වය මගින් හැඩගැසුනු පුද්ගලයකු සැබෑ මුස්ලිම්වරයකු වන අතර දෙවිඳාණන් ආදරය කරන සහ තෘප්තිමත් වන සම්පූර්ණ ඉස්ලාමය ද එය වේ.


සැබෑ මුස්ලිම්වරයකු තම දිව සහ අත ආරක්ෂා කරන තැනැත්තා බව නබිතුමා මෙම හදීසයෙන් අපට පවසා ඇත. ඔහු තම දිවෙන් හෝ අතින් අනෙක් අයට හානියක් නොකරයි.

ඔහු ඔවුන්ට ශාප කරන්නේ නැත. ඔවුන්ට බැණ වදින්නේ නැත. ඔහුගේ දිවෙන් ඔවුන් අපහාස කරන්නේ නැත. ඔවුන්ට පහර දෙන්නේ නැත. ඔවුන්ට ශාරීරික ව හිංසාවන් සිදු කරන්නේ නැත. තම අතින්

ඔවුන්ට අසාධාරණයක් සිදු කරන්නේ නැත.

මුස්ලිම්වරයකුගේ දිවෙන් සහ අතින් සිදු වන නොයෙකුත් හිංසා පීඩාවන් වලින් අන් අය ආරක්ෂිත වන්නේ නම් ඉස්ලාමය සම්පූර්ණ වූ කෙනෙකුගේ ලක්ෂණ එයයි.

තම දිවෙන් හෝ අතින් සාමයෙන් ජීවත් වන්නන්හට හානියක් සිදු කරන අයෙකු ගත් කල, ඔහු තමන් තුළ ඉස්ලාම් දහම සම්පූර්ණ ලෙස මුල් බැස නැති අයෙකි. ඔහු දේව විශ්වාසයෙන් දුර්වලය. භාග්‍යමත් හා උත්තරීතර දෙවිඳාණෝ ඔහු ගැන තෘප්තියට පත් වන්නේ නැත.



# 4

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කුහකයකුගේ සලකුනු තුනකි. ඒවා වනාහි: ඔහු කතා කළේ නම් අසත්‍ය කතා කරයි. ඔහු පොරොන්දු ලබා දුන්නේ නම් එය උල්ලංඝනය කරයි. ඔහු පිළිබඳ විශ්වාස තැබූ කල්හි එය කඩ කරයි." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

කුහකයෝ දෙවිඳාණන්ගේ නිර්මාණ අතරින් අයහපත් ම අය වෙති. ඔවුන්ගේ පරලොව තත්ත්වය ගැන සර්වබලධාරී දෙවිඳාණෝ අපට මෙසේ අනාවරණය කරයි.**"සැබැවින්ම කුහකයින් නිරා ගින්නෙහි පහළම තලයේ වන්නේය. ඔවුන් වෙනුවෙන් නුඹ කිසිදු උදව් කරුවකු නොලබන්නේමය."** (අන් නිසා : 145)

මෙම හදීසයේ, නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ අපට කුහකයකුගේ සලකුණු තුනක් සඳහන් කළහ. මෙය ඔවුන්ගෙන් වැළකී සිටීමට මෙන්ම ඔවුනට කෙරෙන අනතුරු ඇඟවීමක් වශයෙනි.


1. **පළමු සලකුණ:** අසත්‍ය කතා කීම.
2. **දෙවන සලකුණ:** පොරොන්දු කඩ කිරීම.
3. **තුන්වන සලකුණ:** විශ්වාසය කඩ කිරීම.

මේ තුන් ලක්ෂණ කුහකයකුගේ ලක්ෂණ වේ.

එනමුත් දේවත්වය විශ්වාස කරන අයකු (මුඃමින්වරයකු) ගත් කල, ඔහු කතා කරන්නේ නම්, සත්‍යය පමණක් කතා කරයි, බොරු නොකියයි.

ඔහු යමෙකුට පොරොන්දුවක් ලබා දුන් කල්හි, එම පොරොන්දුව කඩ නොකර ඔහු එය ඉටු කරයි. තවද යමෙකු ඔහු කෙරෙහි වූ විශ්වාසය මත යම් භාණ්ඩයක් හෝ යමක් ආරක්ෂාව පිණිස ඔහු වෙත ලබා දුන් විට, ඔහු නොපැකිලිව, ප්‍රමාදයකින් හෝ කල් දැමීමකින් තොරව එය ඔහුට නැවත ලබා දෙයි.

එසේ ම යමෙක් යම් පුවතක් හෝ රහසක් හෝ ඔහුට දන්වා ඒ පුවත හෝ ඒ රහස වසන් කරන ලෙස ඉල්ලා සිටි කල්හි ඔහු එය රකිනවා මිස ඒ පිළිබඳ කිසිවෙකුටත් නොකියයි. මක්නිසාද යත් රහස් හෙළි කිරීම පාවා දීමකි. එයින් අපිව අල්ලාහ් ආරක්ෂා කරත්වා!



# 5

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව ජාබිර් බින් අබ්දුල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "පුද්ගලයෙකු අතරත් දේවත්වයට ආදේශ කිරීම සහ දේවත්වය ප්‍රතික්ෂේප කිරීම අතරත් සලාතය අත්හැරීම පවතී." (මූලාශ්‍රය: මුස්ලිම්)**

## විවරණය

සලාතය යනු සාක්ෂි දැරීමේ ප්‍රකාශ දෙකෙන් පසු ඉස්ලාම් දහමෙහි ප්‍රධානතම කුළුණ වේ. එය ස්ථාපිත කිරීම සඳහා වූ නියෝග සහ එය අත්හැර දැමීම පිළිබඳ තහනම් නියෝග බොහෝ අල්-කුර්ආන් වැකිවල සහ බොහෝ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ හදීස්වල සඳහන්ව පැමිණ ඇත්තේ එබැවිනි.

මෙම හදීසය, සලාතය සම්බන්ධයෙන් සැලකිලිමත් නොවීම පිළිබඳ අනතුර අපට පෙන්වා දෙයි. එහි දී, නබි තුමාණන්, සලාතය අත්හැරීම හැර, පුද්ගලයෙකු අතරත් දේවත්වයට ආදේශ කිරීම සහ දේවත්වය ප්‍රතික්ෂේප කිරීම අතරත් කිසිවක් නොමැති බව පැහැදිලි කළහ. (අල්ලාහ් අප සැම ආරක්ෂා කරත්වා!)

සලාතය අත් හැරීම මහා පාපයක් බවත් එය මහා විනාශයක් බවත් එය පොලිය, අපචාරය, සොරකම, මත්පැන් පානය වැනි මහා පාපයන්ට වඩා -මේ පාපයන් ද මහා පාපයන් වුවද එය- දරුණු පාපයක් බවත් දන්වන පැහැදිලි සාක්ෂි මෙහි ඇත.

මුස්ලිම් වූ සෑම පිරිමියෙක් සහ කාන්තාවක් සලාතය කෙරෙහි දැඩි උනන්දුවෙන් පසු වීම ඒ ගැන ඉතා සැලකිලිමත් වීම අනිවාර්යය වේ. එය ඉටු කිරීම වනාහි යහපත, ආශීර්වාදය සහ පෝෂණය සඳහා හේතුවක් වන අතර ස්වර්ගයට මෙන් ම දෙවිඳාණන්ගේ සමාව සහ තෘප්තියට ද මාර්ගයකි.



# 6

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "දේවත්වය විශ්වාස කරන ශක්තිමත් අයකු, දේවත්වය විශ්වාස කරන දුර්වල අයකුට වඩා අල්ලාහ් ඉදිරියේ විශිෂ්ට ය. තවද ඔහුට ඉතා ප්‍රියමනාප ය. එනමුත් සියල්ලන් තුළ යහපත පවතී." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

දෙවිඳාණන් කෙරෙහි වන අපගේ විශ්වාසය, ඔහු කෙරෙහි වන අපගේ ස්ථාවරභාවය, ඔහුගේ නීති පිළිපැදීම, ඔහුගේ ආගමෙහි ස්ථාවරභාවය, ආගම දහම ඉගෙන ගැනීම යනාදී කරුණු තුළ ශක්තිමත් වන ලෙසත් අපගේ ආධ්‍යාත්මික සහ ලෞකික කටයුතු සියල්ලෙහි අපට ප්‍රයෝජනවත් වන සෑම දෙයක් තුළම ශක්තිමත් වන ලෙසත් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මෙම කෙටි වදන් තුළින් අප දිරිමත් කර ඇත්තාහ.

**"දේවත්වය විශ්වාස කරන ශක්තිමත් අයෙක්, දේවත්වය විශ්වාස කරන දුර්වල අයකුට වඩා අල්ලාහ් ඉදිරියේ විශිෂ්ට ය. තවද ඔහුට ඉතා ප්‍රියමනාප ය."** යන මෙම වදන ම මහිමයෙන් සහ දිරිගැන්වීමෙන් ප්‍රමාණවත් ය.

දේවත්වය විශ්වාස කරන ශක්තිමත් අයෙක් ඔහුගේ ඇදහිල්ලේ ද ඔහු ශක්තිමත් ය. ඔහුගේ චේතනාවන්හි ද ශක්තිමත් ය. ඔහුගේ අධිෂ්ඨානය සහ ක්‍රියාකාරිත්වය තුළ ද ශක්තිමත් ය.

ඊට අනුව, දෙවියාණන් පිළිබඳ විශ්වාසය ශක්තිමත් කරන සෑම

ආකාරයක් මගින් ම එය ශක්තිමත් කර ගත යුතුයි. ඔහු වෙත සමීප කරවන දැහැමි ක්‍රියාවන් හි තරාතිරම් උසස් වීම සඳහා වූ අධිෂ්ඨානය ශක්තිමත් කර ගත යුතුයි. ජීවිතයේ කරදර සහ දුෂ්කරතා වලට මුහුණ දීම සඳහා ඔවුන්ගේ පෞරුෂය ශක්තිමත් කර ගත යුතුයි. දැනුමෙන් සන්නද්ධව තමන්ව ශක්තිමත් කර ගැනීම සහ තමාට සහ තමාගේ සමූහයාට ප්‍රයෝජනවත් වන ඵලදායී අත්දැකීම් මගින් තමන්ව ශක්තිමත් කර ගැනීම සඳහා දේවත්වය විශ්වාස කරන ස්ත්‍රීන් හා පුරුෂයින් හැකි පමණින් උත්සාහ කළ යුතුයි.

**"එනමුත් සියල්ලන් තුළ යහපත පවතී."** යන එතුමාගේ කියමනෙහි වැදගත් ඇඟවීමක් ඇත. එනම් දේවත්වය විශ්වාස කරන්නා - ඔහු ශක්තිමත් හෝ දුර්වල වුවද - ඔහු යහපත මත ම සිටී ය යන්නයි. මන්ද දේවත්වය විශ්වාස කිරීම වනාහි විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් වන විශාල සාධකයකි. එනමුත් දේවත්වය විශ්වාස කරන ශක්තිමත් අයෙක් දේවත්වය විශ්වාස කරන දුර්වල අයකුට වඩා අතිරේක විශේෂාංග කිහිපයකින් කැපී පෙනෙයි. එනම් ඔහු අල්ලාහ් ඉදිරියේ විශිෂ්ඨ ය. තවද ඔහුට ඉතා ප්‍රියමනාප ය.

# 7

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව උස්මාන් ඉබ්නු අෆ්ෆාන් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකු සලාතය සඳහා පරිපූර්ණ ලෙස වුළු නම් අර්ධ දෝවනය කර; පසුව අනිවාර්ය සලාතයක් ඉටු කිරීම සඳහා (දේවස්ථානය වෙත) ගොස් සාමූහිකව එය ඉටු කරන්නේ ද ඔහුගේ පාපයන් අල්ලාහ් කමා කරනු ඇත."(මූලාශ්‍රය: මුස්ලිම්)**

## විවරණය

මෙම හදීසයේ, නබිතුමාණන් ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් පිළිබඳ අපව දැනුවත් කර ඇත. එය කවුරුන් සිදු කරන්නේ ද දෙවිඳාණන් ඔහුට ගෞරවණීය වේතනයක් ලබා දෙනු ඇත. ඒ ගෞරවණීය වේතනය නම්: ඔහුගේ පාපයන් සඳහා සමාව දීම වේ.

මෙය ඍජුව සලාතය සමඟ සම්බන්ධ වන අතර එය මුස්ලිම්වරයෙකු සර්වබලධාරී දෙවිඳාණන් වෙත සමීප වීමට සිදු කරන කරුණු තුනකින් සමන්විත වේ:

1. **පළමුවැන්න:** වුළු නම් අර්ධ දෝවනය සම්පූර්ණ ලෙස සිදු කිරීම: සම්පූර්ණ ලෙස පිරිසිදු කිරීම යනු ශරීරයේ පිරිසිදු කළ යුතු සෑම කොටසක් වෙත ම ජලය නිශ්චිත පරිදි සේන්දු කරවා පූර්ණ ලෙස පිරිසිදු කරමින් එම අර්ධ දෝවනය ඉටු කිරීම.
2. අනිවාර්ය සලාතය ඉටු කිරීමේ අදහසින් මස්ජිදය වෙත ඇවිද යාම.

3 **තුන්වැන්න:** මුස්ලිම්වරුන් සමඟ එක් වී සාමූහික ව සලාතය ඉටු කිරීම.

කවරෙකු සම්පූර්ණ ලෙස වුළු නම් අර්ද දෝවනය සිදු කිරීමෙන් පසුව මස්ජිදය වෙත පැමිණ මුස්ලිම්වරුන් සමඟ එක් වී සාමූහික ව සලාතය ඉටු කරන්නේ ද එවිට මෙම උතුම් වේතනය ඔහුට ලැබේ. එනම්: දෙවිඳාණන් ඔහුගේ පාපයන්ට සමාව දෙනු ඇත. කවරකුගේ පාපයන් සඳහා දෙවිඳන්ගේ සමාව ලැබුණේ ද ඔහු මෙලොව සහ පරලොව සාර්ථක කර ගත් අය අතරින් කෙනෙකි.



8

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෛයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකු මා කෙරෙහි ඕනෑකමින් බොරු ගොතා පැවසුවේ ද නරකාදියේ ඔහු සඳහා ලැගුම් ස්ථානයක් ඔහු වෙන් කර ගනිත්වා!"** මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්

## විවරණය

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ හදීස් නොහොත් සම්ප්‍රදායන් හි බොරු ගොතා කීම මහා පාපයක් මෙන්ම බරපතල වරදකි. යමෙක් කථාවක් නිර්මාණය කර එය නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ වදන් වලින් එකකි යැයි ප්‍රකාශ කරන්නේ නම් සැබැවින්ම ඔහු මහා පාපයක් සිදු කරන්නෙකි.

තවද යමෙක් අල්ලාහ්ගේ දූතයාණන් නොපැසූ අසත්‍ය කියමනක් - එය අසත්‍ය බව පැහැදිලි නොකර - එය වාර්තා කරන්නේ ද ඔහු ද මහා අපරාධයක් හා අති විශාල වරදක් සිදු කළ අයකි.

නබිතුමා නොපැවසූ ගොතනු ලැබූ අසත්‍ය හදීස් ව්‍යාප්ත ව පැවතීම කණගාටුදායක කරුණකි. ඇතැම් දැහැමි පුද්ගලයින් -යහපත් චේතනාවෙන්- ඇතැම් විට මෙම අසත්‍ය හදීස් ප්‍රකාශයට පත් කරති. මෙය මහා නපුරු ක්‍රියාවක් වන අතර මෙය අප විසින් අනතුරු අඟවා අවවාද කළ යුතු කරුණකි. එහෙයින් නබි (සල්) තුමාණන් පිළිබඳ අසත්‍ය ප්‍රකාශ කිරීම වනාහි එය ඉතා අවලස්සන ම අසත්‍ය ප්‍රකාශයක් වීම ගැන කිසිදු සැකයක් නැත.

එතුමාණන් මෙසේ පැවසූහ: "මා ගැන අසත්‍ය පැවසීම වෙනත් කිසිවකු ගැන අසත්‍ය පැවසීම මෙන් නොවේ. යමෙක් මා ගැන හිතා මතා අසත්‍ය පවසන්නේ ද නරකාදියේ ඔහු සඳහා ලැගුම් ස්ථානයක් ඔහු වෙන් කර ගනිත්වා." (මූලාශ්‍රය: බුහාරි සහ මුස්ලිම්)

තවද එතුමාණන් මෙසේ පැවසූහ : "යමෙක් මා පිළිබඳ යම් ප්‍රකාශයක් සිදු කරන විට එය අසත්‍ය බව දැන ගෙන සිටියේ ද ඔහු මුසාවාදීන්ගෙන් කෙනෙකි." (මූලාශ්‍රය: තිර්මිදි)

යම් හෝ ප්‍රකාශයක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට ආරෝපණය කිරීමට පෙර ඒවායේ සත්‍යතාව තහවුරු කර ගැනීම අපගේ වගකීම වේ.

තවද වර්තමානය වන විට විශ්වාසදායක පොත් සහ වෙබ් අඩවි සමාලෝචනය කිරීමෙන් හදීසයක සත්‍යතාව තහවුරු කර ගැනීමට අල්ලාහ් අපට පහසු කර දී ඇත. එය අප කෙරෙහි ඔහු කළ කරුණාව හේතුවෙනි.

මෙම ක්ෂේත්‍රයේ වඩාත් ප්‍රසිද්ධ පොත් අතර ෂෙයික් මුහම්මද් නාසිරුද්දීන් අල්-අල්බානිතුමාගේ පොත් අපට දැක ගත හැක.

අන්තර්ජාලයේ ඇති වඩාත් ප්‍රසිද්ධ වෙබ් අඩවි: ෂබකතුස් සුන්නා අන් නබවියියා වඋලූමිහා සහ අල්-දුරර් අල්-සුන්නියියා වෙබ් අඩවියේ හදීස් විශ්වකෝෂය.

# 9

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකුගේ සිත තුළ අණුවක තරම් ප්‍රමාණයක් උඩගුකම තිබුණේ ද ඔහු ස්වර්ගයට ප්‍රවේශ නොවනු ඇත."** (මූලාශ්‍රය: මුස්ලිම්)

## විවරණය

ඉස්ලාම් දහම ගුණවත් සාරධර්මවලින් පිරිපුන් දහමකි. එබැවින් එය මෘදුකම සහ නිහතමානිකම මිනිසුනට නියම කර, උද්ධච්චකම, අහංකාරය සහ උඩගුකම ඔවුනට තහනම් කළේය.

තවද මෙම හදීසයේ, මිනිසුන් හෙළා දකින සහ ඔවුන් කෙරෙහි උඩගු වූ අහංකාර මිනිසුන්ට නබි තුමාණන්ගෙන් අනතුරු ඇඟවීමක් පැමිණ ඇත. උඩගුකම් පෑ අය ස්වර්ගයට නොපිවිසෙති. අල්ලාහ් අපව ආරක්ෂා කරත්වා!

**"කවරෙකුගේ සිත තුළ අණුවක් තරම් ප්‍රමාණයක් හෝ උඩගුකම තිබුණේ ද ඔහු ස්වර්ගයට ප්‍රවේශ නොවනු ඇත."** යන එතුමාගේ ප්‍රකාශයෙහි අර්ථය වනාහි "අණුවක තරම් උද්ධච්චකම සිතේ ඇති තැනැත්තා ස්වර්ගයට ඇතුල් නොවන්නේය" යන්නයි. අණුවක බර යනු ඉතා කුඩා ප්‍රමාණයකි.

තවද නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් උඩගුකමේ

අර්ථය ගැන අපට මෙසේ විග්‍රහ කළහ: **"උඩඟුකම යනු සත්‍යය යට ගසා මිනිසුන්ට අපහාස කිරීම වේ"** (මූලාශ්‍රය: මුස්ලිම්). එහි තේරුම සත්‍ය ප්‍රතික්ෂේප කිරීම සහ මිනිසුන් දෙස පහත් කොට බැලීම, ඔවුන්ව හෙළා දැකීම යන්නයි.

උඩඟුකම තහනම් කිරීම සහ එය හෙළා දැකීම සඳහා වූ තවත් සාධකයක් වනුයේ නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ මෙම ප්‍රකාශයයි. එනම්: **"තමා ගැන අහංකාර වූ, ඇවිදීමේ දී උද්ධච්චකම පෙන් වූ අයෙකු දෙවිඳාණන් ඔහු කෙරෙහි කෝපයට ලක් වූ අයුරින් ඔහු ඔහුව හමුවන්නේය."** (මූලාශ්‍රය: බුහාරි : අදබුල් මුෆ්රද්)

උඩඟුකම මහා පාපයක් බව සහ නින්දා සහගත හැසිරීමක් බව අප දැනගත් පසු අපි එයින් වැළකී, උපදෙස් පිළිගැනීම, සත්‍යයට යටත් වීම, දුප්පතුන්ට, දුබලයන්ට, අසරණයින්ට, සේවකයන්ට සහ ඒ හා සමාන අයට ආදරය කිරීම, ඔවුන්ට කරුණාව දැක්වීම, ඔවුන් රැකබලා ගැනීම සහ ඔවුන්ට නිහතමානී වීම වැනි උඩඟුකමින් අප ඈත් කරවන යහපත් ක්‍රියාවන් සිදු කළ යුතුයි. මේ කරුණු හදවත පිරිසිදු කරන අතර උද්ධච්චකම, අහංකාරය සහ උඩඟුකමෙන් ආත්මය පිරිසිදු කරයි.

# 10

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව උස්මාන් ඉබ්නු අෆ්ෆාන් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබ අතරින් ශ්‍රේෂ්ඨ වනුයේ, අල් කුර්ආනය ඉගෙන; එය අන් අයටත් උගන්වන තැනැත්තාය." (මූලාශ්‍රය: බුහාරි)**

## විවරණය

මෙම හදීසය උතුම් අල්කුර්ආනය ඉගෙනීමේ හා ඉගැන්වීමේ වැදගත්කම පෙන්වා දෙයි. අල්කුර්ආනය ඉගෙන ගන්නා අය සහ එය උගන්වන අය මිනිසුන් අතරින් යහපත්, ශ්‍රේෂ්ඨ හා පාරිශුද්ධ අය බව නබිතුමාණන් අපට පෙන්වා දුන්හ.

උස්මාන් ඉබ්නු අෆ්ෆාන් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් ලබා මෙම හදීසය ප්‍රකාශ කළ උතුම් තාබිඊවරයකු වන අබූ අබ්දුර්-රහ්මාන් අල්-සුලමි(රහ්මතුල්ලාහි අලෛයිහි) තුමාණන් මෙසේ පැවසූහ: "මා මේ ආසනය මත හිඳ වූ කරුණ මෙයයි." එනම් ඉහත සඳහන් කළ විශේෂත්වය සහ මහිමය අපේක්ෂාවෙන් එතුමා වසර ගණනාවක් අල්කුර්ආනය උගන්වමින් එහි අසුන් ගෙන සිටීහ.

ඒ අනුව; අල්කුර්ආනය කෙරෙහි අවධානය යොමු කර එය හොඳින් ඉගෙන ගැනීම, එය ප්‍රගුණ කිරීම, පසුව එය අන් අයට ඉගැන්වීම සඳහා උත්සාහ කිරීම සෑම මුස්ලිම් කාන්තා පිරිමියෙකුගේ ම යුතුකමයි.

අල්කුර්ආනය ඉගෙනීම සඳහා මස්ජිද්, පාසල් සහ අධ්‍යාපන ආයතනවල පැවැත්වෙන අල් කුර්ආන් කටපාඩම් පාඨමාලාවන් සමඟ සම්බන්ධ වීම වඩාත් ප්‍රයෝජනවත් සහ ගුණවත් කරුණක් වන්නේය. කවුරුන් එසේ කරන්නේ ද ඔහු යහපත, ආලෝකය සහ මග පෙන්වීම මත ම පිහිටනු ඇත.



# 11

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "වදන් දෙකක් ඇත. ඒ දෙක දිවට ඉතා පහසුය. තුලාවෙහි ඒ දෙක ඉතා බරතිය. ඒ දෙක කරුණාන්විතයාණන්ට ඉතා ප්‍රියමනාපය. ඒ දෙක වනාහි, "සුබ්හානල්ලාහි වබිහම්දිහී, සුබ්හානල්ලාහිල් අළීම්" ය." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ අල්ලාහ්ව මෙනෙහි කිරීම පිළිබඳ බොහෝසෙයින් අප දිරිගන්වා ඒවායෙහි තිබෙන මහිමය සහ වැදගත්කම අපට පහදා දුන් අතර, උදෑසන සහ සවස කිව යුතු මෙනෙහිකිරීම් ද නිදා ගැනීමේදී සහ නින්දෙන් අවදි වූ විට කිව යුතු මෙනහිකිරීම් ද අපට නියම කළහ. මේ හා සම්බන්ධ මෙනෙහිකිරීම් සහ එවැනි සියලු මෙනෙහි කිරීම් නවවිතුමාගේ "අල්-අද්කාර්", ඉබ්න් බාස්තුමාගේ "තුහ්ෆත් අල්-අහ්යාර්", අල්-කහ්තානිතුමාගේ "හිස්නුල් මුස්ලිම්" සහ තවත් බොහෝ පොත් වල සඳහන් වේ.

මුස්ලිම්වරයෙකුට සෑම විටම පැවසීම සඳහා යෝග්‍ය පොදු මෙනෙහි කිරීම් ඇත. වේලාවක් හෝ සංඛ්‍යාවක් සීමා නොකර ඒවා අධික ලෙස පැවසීම සුන්නත් වේ. ඒවා අතරින්: සුබ්හානල්ලාහ්, (අල්ලාහ් සුවිශුද්ධය) අල්හම්දු ලිල්ලාහ්, (සියලු පැසසුම් අල්ලාහ්ටය) ලා ඉලාහ ඉල්ලල්ලාහ්, (අල්ලාහ් හැර නැමදුමට සුදුසු අන් කවරෙකු හෝ නොමැත) අල්ලාහු අක්බර්, (අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය) ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ් (අල්ලාහ්ගෙන් මිස් බලයක් හෝ ශක්තියක් නැත) යන මෙනෙහි කිරීම් ඇතුළත් වේ.

**"සුබ්හාල්ලාහි වබිහම්දිහී සුබ්හානල්ලාහිල් අළීම්"** (අල්ලාහ් සුවිශුද්ධය. සියලු ප්‍රශංසා ඔහුටම ය, අල්ලාහ් සුවිශුද්ධය. ඔහු ශ්‍රේෂ්ඨය) යන මෙම උතුම් වදන් දෙක ද එවැනි මෙනෙහිකිරීම් අතරිනි. අපගේ නබි තුමාණන්, ඒවා ලක්ෂණ තුනකින් කැපී පෙනෙන බව අපට පැහැදිලි කළහ.

1 **ඒ දෙක දිවට ඉතා පහසුය:** එබැවින් පුද්ගලයෙකුට අපහසුවකින් තොරව ඒවා විටින් විට පැවසීම ඉතා පහසු වන්නේය.

2 **තුලාවෙහි ඒ දෙක ඉතා බරැතිය:** මෙයින් අදහස් වන්නේ ඒවා පවසන තැනැත්තාට දෙවිඳාණන් ඔහුගේ යහපත් ක්‍රියාවන්හි තරාදිය පුරවන විශාල වේතනයක් ඔහුට හිමිවනු ඇත යන්නයි.

3 **ඒ දෙක කරුණාන්විතයාණන්ට ඉතා ප්‍රියමනාපය: එනම් භාග්‍යවත් වූත් උත්තම වූත් දෙවිඳාණන් ඒවා ප්‍රිය කරනු ඇත. මෙයින් ඇඟවෙන්නේ ඒවා ඉතා වැදගත් හා ශ්‍රේෂ්ඨ වදන් දෙකක් බවයි.**

මේ හේතු සියල්ල පිණිසම: ඒ උතුම් වදන් දෙක කෙරෙහිත්, අනිකුත් මෙනෙහි කිරීම් කෙරෙහිත් අවධානය යොමු කොට, ඒ කෙරෙහි උනන්දු වී, සෑම වේලාවකම සහ සෑම තත්ත්වයක දී ම අධික ලෙස අප ඒවා පැවසිය යුතු ය. එමගින් අපට භාග්‍යවත් වූත් උත්තම වූත් දෙවිඳාණන්ගේ මහත් වූ වේතනය ලැබෙනු ඇත.

# 12

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "සෑම මසකම දින තුනක උපවාසය, ළුහා සලාතයේ රක්ආත් දෙක සහ නිදාගැනීමට පෙර විත්ර් සලාතය ඉටු කිරීම යන කරුණු තුන පිළිබඳ මාගේ කලයාණ මිතුරා (ඔහු කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත් වේවා!) මට උපදෙස් දුන්හ." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා ධර්ම දූතයාණන්ට ඉතා සමීප ශ්‍රේෂ්ඨ සහාබිවරයකි.

මෙම නබි වදනෙහි සඳහන් (خليل(ක)හලීල්) යන පදය (حبيب හබීබ්) මිතුරා යන පදයට සමාන නමුත් (خليل(ක)හලීල්) යන පදය ඉතා විශාල ආදරයක් පෙන්නුම් කරයි. එය (හබීබ්) යන පදයට වඩා අර්ථයෙන් ඉමහත්ය. එතුමාට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ උපදෙස් තුන එතුමා අපට මෙසේ දන්වා සිටියි.

**පළමු උපදෙස:** සෑම මසකම දින තුනක් උපවාසයේ නියැලීම. සෑම මසකම දින තුනක් උපවාසයේ නියැලීම උතුම් සුන්නාවක් වන අතර, සෑම මසකම දින තුනක් උපවාසයේ නියැලීම ජීවිත කාලය පුරාවටම උපවාසයේ නියැලීම හා සමාන බව නබි තුමාණන් පවසා ඇත. **(මූලාශ්‍රය: බුහාරි)** මෙය තම ගැත්තන් කෙරෙහි අල්ලාහ්ගේ ත්‍යාගශීලීත්වය සහ කරුණාව පෙන්නුම් කරයි.

අනිවාර්ය නොවන වෛකල්පිත (සුන්නත්) වූ උපවාස තුනක් මෙමගින්

අදහස් කෙරේ. එනම්, පුද්ගලයෙකු අඛණ්ඩව දින තුනක් හෝ වෙන් වෙන් ව දින තුනක් හෝ වේවා සෑම මසක ම දින තුනක් උපවාසයේ නියැලිය යුතුයි.

**දෙවන උපදෙස:** ළුහා සලාතය ඉටු කිරීම. එය මධ්‍යම උදෑසන ඉටු කරන රක්අත් දෙකකින් හෝ වැඩි ගණනකින් සමන්විත වන සලාතයකි. එබැවින් එම වේලාවේ රක්අත් දෙකක් හෝ හතරක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් ඉටු කිරීම මුස්ලිම්වරයෙකුට යෝග්‍ය වේ. එහි වේතනය ඉමහත්ය, මහිමය ද ඉමහත්ය.

**තුන්වන උපදෙස:** විත්ර් සලාතය. විත්ර් යනු වෛකල්පිත සලාතයන් අතරින් විශිෂ්ට සලාත් වර්ගයකි. එහි වේලාව ඉෂා සලාතයෙන් පසු ෆජ්ර් සලාතයේ අදාන් නොහොත් ඇරයුම දක්වා පිහිටී ඇත. එය රක්අත් එකක්, හෝ තුනක් හෝ පහක් හෝ ඊට වැඩි ගණනකින් ඉටු කළ හැක. ඒවායෙහි සංඛ්‍යාව ඔත්තේ වීම වැදගත් වන අතර විත්ර් යන වචනයෙන් අදහස් කරන්නේ ද එයයි.

මේ කරුණු තුන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාහට මෙන් ම අපහට කළ උපදෙසක් ද වේ.

# 13

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ගැත්තෙකු තම පරමාධිපතියාණන්ට ඉතා සමීප වන්නේ ඔහු සිරස නමා සුජූද් කරමින් සිටින අවස්ථාවෙහිය. එහෙයින් ඔබ එහි අධික ලෙස අයැදින්න."** (මූලාශ්‍රය: මුස්ලිම්)

## විවරණය

උත්තරීතර, මහෝත්තම දෙවිඳාණන් සියලු ආකාරයේ නැමදුම් ක්‍රියාවලින් හා කීකරුකමෙන් තමන් වෙත ළං වන ලෙස තම ගැත්තන්ට නියෝග කර තිබේ.


කෙනෙකු දෙවිඳාණන් වෙත සමීප කරවන ශ්‍රේෂ්ඨතම කරුණ වන්නේ -අනිවාර්ය හෝ අනිවාර්ය නොවන- සලාතයයි. මුස්ලිම්වරයෙකු සලාතය තුළට ඇතුල් වන්නේ නම්, ඔහු සර්වබලධාරී දෙවිඳාණන්ට ඉතා සමීපව සිටී.

සලාතයේ සෑම අංගයක්ම දෙවිඳාණන් වෙත සමීප කරවන නමුත්, සිරස පොළෝ මත තබා සුජූද් කිරීමේදී, දෙවිඳාණන් වෙත ළං වන ශ්‍රේෂ්ඨතම තත්ත්වයක කෙනෙකු පසු වේ. මන්ද සුජූද්හිදී දෙවිඳාණන්ට ඔහු යටත් වේ. ඔහුව මහිමයට පත් කරයි. ඔහුව සුවිශුද්ධ කරයි. ඔහු නිහතමානීව, බියබැතිමත්ව සහ අසරණකමින් ඔහුගෙන් අයැද සිටී.

එබැවින්, සුජූද් යනු කරනු ලබන අයැදීම් පිළගනු ලබන ස්ථානයකි. ඉමාම් මුස්ලිම් විසින් වාර්තා කරන ලද තවත් හදීසයක මෙසේ ඒ බව නබි

(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්  සඳහන් කර ඇත. “සුජූද් වනාහි එහි අධිකව අයැද සිටීමට උත්සහ කරන්න. මන් ද එය පිළිගැනීමට ඉතා සුදුසුය.”

එමනිසා, පුද්ගලයෙකු දිගු වේලාවක් සුජූද් හි ගත කිරීම සහ එහි බොහෝ ප්‍රාර්ථනා අයැද සිටීම සුන්නාහ් වේ. සුජූද් කිරීම සහ අයැද සිටීම යන කරුණු දෙක මෙලොව සහ පරලොව යහපත හා සාර්ථකත්වය සඳහා ඇති ශ්‍රේෂ්ඨතම සාධක වේ.



# 14

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව සාබිත් බින් ළහ්හාක් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "දේවත්වය විශ්වාස කරන අයෙකුට ශාප කිරීම ඔහුව ඝාතනය කිරීම හා සමානය."** (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

ශාප කිරීම මහා පාපයකි. අපගේ නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් යමෙකුට ශාප කිරීම පිළිබඳ අපට අනතුරු ඇඟවූ අතර, මෙම හදීසය ඇතුළු බොහෝ හදීස් වල එය තහනම් කර ඇත. එමෙන්ම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ද ප්‍රකාශ කර ඇත:

**"අල්ලාහ්ගේ ශාපයෙන් හෝ ඔහුගේ කෝපයෙන් ඔබ එකිනෙකා ශාප නොකරන්න."** (මූලාශ්‍රය: අබු දාවූද් සහ තිර්මිදි)

තවද නබිතුමාණෝ මෙසේ පැවසූහ:, **"අයුතු ලෙස දෙයකට ශාප කරන තැනැත්තා වෙතට එම ශාපය නැවත පැමිණේ."** (මූලාශ්‍රය: අබු දාවූද් සහ තිර්මිදි) එම පදයේ තේරුම: යම් කිසි දෙයකට අසාධාරණ ලෙස ශාප කරන විට, ශාපය ඔහු වෙත, එනම් එය පැවසූ තැනැත්තා වෙත ආපසු පැමිණෙනු ඇත යන්නයි.

සලාමා බින් අල්-අක්වා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පැවසීය: **"මිනිසෙකු තම සහෝදරයාට ශාප කිරීම අප දුටුවේ නම්, ඔහු මහා පාපකාරී ක්‍රියාවක් කළ බව අපි සිතුවෙමු."** (අත් තබරානී)

**"මුස්ලිම්වරයෙකුට ශාප කිරීම විශාල පාපයකි."** යැයි ඉබ්න් බාස් (රහ්මතුල්ලාහි අලෙයිහි) තුමා පවසා ඇත්තේය.

බොහෝ මුස්ලිම්වරුන් අතර ශාප කිරීමේ පුරුද්ද පැතිර තිබීම කණගාටුදායක හා අවාසනාවන්ත කරුණකි. (දෙවිඳාණන් අප සැම එයින් ආරක්ෂා කරත්වා!)

එය ප්‍රතික්ෂේප කිරීම සහ එයින් වැළකී සිට අන් අයවත් එයින් වැළැක්වීම අපගේ යුතුකමකි.

# 15

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කළේය. අහෝ ආදම්ගේ දරුව! නුඹ වියදම් කරනු. නුඹ වෙනුවෙන් මා වියදම් කරමි." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

දෙවිඳාණන් තම විශ්වාසවන්ත ගැත්තන් ව ප්‍රශංසා කළ ශ්‍රේෂ්ඨතම ගුණාංග අතර ඔහුගේ මාර්ගයේ වියදම් කිරීමේ ගුණාංගය ද එකකි. ඒ බව ඔහු මෙසේ සඳහන් කරයි: "අලිෆ්, ලාම්, මීම්, එම පුස්තකය, එහි කිසිදු සැකයක් නැත. බිය බැතිමතුන් හට (එය) මඟ පෙන්වන්නකි. ඔවුහු කවරහු ද යත් ගුප්ත දෑ පිළිබඳ ව විශ්වාස කරති. සලාතය ස්ථාපිත කරති. තව ද අප ඔවුන ට ලබා දුන් දැයින් වියදම් කරති." (අල් බකරා: 1-3)

වියදම් කිරීම තුළ කරුණු බොහෝමයක් අන්තර් ගත වේ. ස්වාමි පුරුෂයකු තම බිරිඳ සහ දරුවන් වෙනුවෙන් කරන වියදම, සාමාන්‍ය මිනිසකු දුප්පතුන් සහ අසරණයන් සඳහා කරන වියදම්, අල් කුර්ආනය ප්‍රකාශනය කිරීම, ප්‍රයෝජනවත් පොත්පත් බෙදා හැරීම, රෝගීන්ට ප්‍රතිකාර කිරීම සහ වෙනත් එවැනි පුණ්‍ය කටයුතු සඳහා කරන වියදම් ඒවා අතර වේ.

තවද තම මුදල් පුණ්‍ය කටයුතු සඳහා වියදම් කරන තැනැත්තාට මෙම හදීසයේ සර්වබලධාරී දෙවිඳාණන්ගේ පොරොන්දුවක් පැමිණ ඇත.

එනම් ඔහු වෙනුවෙන් ඔහු වියදම් කරනු ඇත යන්නයි. එමෙන් ම ඔහුගේ ආශිර්වාදයෙන් ඔහුට පෝෂණය ලබා දෙනු ඇත.  එමෙන්ම ඔහු වියදම් කළ දෑ වෙනුවට ඔහුගේ විශාල ත්‍යාගය ඔහුට ලබා දෙනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි: “නියත වශයෙන්ම මාගේ පරමාධිපති ඔහුගේ ගැත්තන් අතරින් ඔහු අභිමත කරන අයට පෝෂණ සම්පත් ව්‍යාප්ත කර දෙයි. තවද ඔහුට (එය) සීමා කරයි. තවද නුඹලා කවර දෙයක් වියදම් කරන්නෙහු ද එය ඔහුට පසු ගෙවනු ඇත. තවද ඔහු පෝෂණ සම්පත් ලබා දෙන්නන්ගෙන් අති ශ්‍රේෂ්ඨය” යැයි (නබිවරය) පවසනු.” (සබඃ 39)

යමෙක් සිය පවුලට, දෙමාපියන්ට, ඥාතීන්ට, දුප්පතුන්ට සහ අසරණයන්ට වියදම් කරන්නේ ද තවද විවිධ පුණ්‍ය කටයුතු සඳහා වියදම් කරන්නේ ද දෙවිඳාණන් ඔහුට වේතනය ලියා ඔහු වියදම් කළ දෙය වෙනුවෙන් ඔහුට පෝෂණය ලබා දෙනු ඇත. එය අල්ලාහ්ගේ කරුණාව හේතුවෙනි. අල්ලාහ් ඔහු අභිමත කරන ඕනෑම කෙනෙකුට එය ලබා දෙයි. තවද ඔහු මහත් ත්‍යාගශීලී ය.



# 16

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෛයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "මුස්ලිම්වරයකුට යම් වෙහෙසක් හෝ රෝගයක් හෝ දුකක් හෝ කණගාටුවක් හෝ හිංසාවක් හෝ දැඩි කම්පනයක් හෝ ඇති වන්නේ නම්, එය ඔහුට ඇනෙන කටුවකින් හෝ වුව ද එමගින් අල්ලාහ් ඔහුගේ පාපයන් කමා කරනු ඇත." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

මෙලොවෙහි මිනිසා අනේක විද දුක් පිඩා වලට ගොදුරු වේ.

තවද මෙම හදීසයේ, නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ අපගේ සියලු තත්ත්වයන් තුළ අප මතක තබා ගත යුතු උතුම් කාරණාවක් ගැන අපට දන්වා සිටියහ. එය අපේ සිත පිනවන, ආත්මය සනසන, අපට සහනය ගෙන දෙන උතුම් කාරණයකි.

එනම්: "මුස්ලිම්වරයකුට යම් වෙහෙසක් හෝ රෝගයක්, දුකක්, කණගාටුවක්, හිංසාවක්, දැඩි කම්පනයක් හෝ ඇති වන්නේ නම්" එමගින් අල්ලාහ් ඔහුගේ පාපයන් කමා කරනු ඇත. මෙම තත්ත්වයන් සියල්ල පාපයන් කමා කරවන, ඒවා ඔහුගෙන් පහ කරවන හේතු සාධක මෙන් පවතී. මේ කාරණා හේතුවෙන් ඔහු පවෙන් නිදහස් වී පිවිතුරු තත්ත්වයකින් එයින් බැහැරවනු ඇත. එවිට ඔහු තම පරමාධිපතියාණන් වෙත ඉතා සමීප අයකු බවට පත් වේ.

"එය ඔහුට ඇනෙන මුලකින් වුව ද" යන ප්‍රකාශයෙහි එයින් ඇති වන තුවාලයක් වැනි සුළු තුවාලයකින් වුව ද, මිනිසකුට සිදුවන හානියෙන්

ඔහුගේ පාපයන් සඳහා සමාව හිමි වන බව  දන්වා ඇත.

මුස්ලිම්වරයකු මේ පිළිබඳ දැනුවත් වූයේ නම්, ඔහු දෙවිඳාණන්ගේ මෙම කරුණාව පිළිබඳ සතුටු වෙත්වා! සෑම විටකම ඉවසිලිවන්තව සහ කුසල් අපේක්ෂාවෙන් හිඳ ඔහු පිළිබඳ තෘප්තිමත් වීමට උනන්දු වෙත්වා! කවරෙකු දෙවිඳාණන් පිළිබඳ තෘප්තිමත් වූයේ ද ඔහු කෙරෙහි දෙවිඳාණන් ද තෘප්තියට පත් වී ඔහුට ගෞරවය කරනු ඇත. තවද ඔහුට ආශීර්වාද කර සියල්ල පිරිනමනු ඇත.



# 17

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබ දේවත්වය විශ්වාස කරන තෙක් ස්වර්ගයට ප්‍රවේශ නොවනු ඇත. ඔබ එකිනෙකා ආදරය කරන තෙක් දේවත්වය විශ්වාස නොකරනු ඇත. ඔබ යමක් සිදු කළේ නම් එමගින් ඔබ අතර ආදරය ඇති වන කරුණක් මා ඔබට දන්වා සිටින්න ද? ඔබ අතර සලාමය ප්‍රචලිත කරන්න." (මූලාශ්‍රය: මුස්ලිම්)**

## විවරණය

අප එකිනෙකා සමඟ ආදරයෙන් බැඳී සිටීම යන ඉතා වැදගත් කරුණ පිළිබඳ මෙම හදීසය දිරිගන්වයි.

අප විශ්වාස කරන තුරු අප ස්වර්ගයට ඇතුළු නොවන බවත්, අප එකිනෙකා ආදරය කරන තුරු අප සැබවින්ම විශ්වාස කරන්නන් නොවන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අපට උපදෙස් දී ඇත්තාහ.

අප එකිනෙකා අතර ආදරය හා බැඳීම ඇති කරන, පහසු කරුණක් තිබේ. එය සිදු කළ විට, අප අතර ආදරය හා බැඳීම ව්‍යාප්ත වනු ඇත.

එවැනි සරල හා පහසු දෙය වනාහි: ජනයා අතර සලාම් පැවසීම හා පැතිරවීමයි. මුස්ලිම්වරුන් අතර සාමය, ඔවුන් අතර ආදරය ඇතිවීමට හේතුවක් වේ. ආදරය ඇතිවීම විශ්වාසය වැඩි වීමට හේතුවක් වේ. විශ්වාසය වැඩි වීම ස්වර්ගයට ඇතුළු වීමට හේතුවක් වේ යන වග අපි මෙම හදීසයෙන් දැන ගත්තෙමු.

සලාමය පවසන ක්‍රම වලින් හොඳම ක්‍රමය: “අස්සසලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු” යනුවෙන් පැවසීමය. එහි අර්ථය: සාමය, දෙවිඳාණන්ගේ දයාව හා ආශිර්වාදය ඔබට ලැබේවා!

එයට ප්‍රතිචාරය දක්වන හොඳම ක්‍රමය : “වඅලෙයිකුමුස් සලාම් වරහ්මතුල්ලාහි වබරකාතුහු” යනුවෙන් පැවසීම වේ. එහි අර්ථය: තවද සාමය, දෙවිඳාණන්ගේ දයාව හා ආශිර්වාදය ඔබටත් ලැබේවා!

යම් පුද්ගලයෙක් “අස්සලාමු අලෙයිකුම්” යනුවෙන් හෝ “අස්සලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහ්” යනුවෙන් හෝ සලාම් පැවසුවේ නම්: එය ද ප්‍රමාණවත් ය. එනමුත් “අස්සසලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු” යනුවෙන් සම්පූර්ණ ලෙස සලාමය පැවසීම වඩා උචිතය.

එබැවින් මුස්ලිම්වරයකු සලාමය පතුරුවා හැරීමට උනන්දු විය යුතු අතර ඒ ගැන වඩාත් සැලකිලිමත් විය යුතුයි. එමෙන්ම සලාම් පැවසීමට ලැජ්ජා නොවිය යුතු ය. මන්ද එය කුසල් හිමි වීමට හේතුවක් මෙන් ම විශ්වාසය වැඩි වීමට සහ ස්වර්ගයට ඇතුළු වීමට ද හේතුවකි.

# 18

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ සර්ද් අල්කුද්රි (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "පිරිමියකු තවත් පිරිමියකුගේ රහසඟ (අව්රත්) දෙස නොබැලිය යුතුය. තවද කාන්තාවකු තවත් කාන්තාවකගේ රහසඟ දෙස නොබැලිය යුතුය." (මූලාශ්‍රය: මුස්ලිම්)**

## විවරණය

මෙම හදීසය අප දැනගෙන ක්‍රියා කළ යුතු ඉතා වැදගත් කරුණක් පෙන්වා දෙයි.

යම් පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් හෝ වේවා ඔහු හෝ ඇය විසින් ආවරණය කළ යුතු රහසඟ ඇත. අන් අය ඒ දෙස නොබැලිය යුතු අතර එයින් තම බැල්ම පහත් කළ යුතු ය.

මෙය පිරිමියෙක් තවත් පිරිමියෙකු සමඟ සහ කාන්තාවක් තවත් කාන්තාවක සමඟ කටයුතු කළ යුතු ආකාරය මෙය වේ නම් කාන්තාවක් තවත් පිරිමියෙක් සමඟ සහ පිරිමියෙක් තවත් කාන්තාවක් සමඟ කටයුතු කළ යුතු ආකාරය ඊටත් වඩා බරපතල බව අප දැන ගත යුතුයි.

එහෙයින් අපි අපගේ රහසඟ ආරක්ෂා කළ යුතු අතර ඒවා පොදු මිනිසුන්ට නො පෙනෙන අයුරින් හෙළි නො කර ආවරණය කළ යුතුයි. අන් අයගේ රහසඟ දෙස බැලීම ඒවා ස්පර්ශ කිරීම යන කරුණ කිසි දා සුළු

කොට නො තැකිය යුතු ය. තවද මෙම කාරණය පිළිබඳ නොසැලකිලිමත් වීම, ඒ විෂය විහිළුවට ගැනීම කිසිසේත් සුදුසු නොවන බව ද අප දැන සිටිය යුතුයි.

# 19

අස්-සඃබ් බින් ජස්සාමා (රළියල්ලාහු අන්හු) තුමන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔහු අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) වෙත දඩයම් කළ සතෙකු ප්‍රදානය කළේය. එතුමාණෝ එය නොපිළිගෙන නැවත ඔහුට ලබා දුන්හ. ඒ සිදුවීම හේතුවෙන් ඔහුගේ මුහුණෙහි කණගාටුව දුටු නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) මෙසේ ප්‍රකාශ කළහ. සැබැවින්ම අපි ඉහ්රාම් තත්ත්වයේ සිටින්නෙමු. අපි එය ඔබට නැවත ලබා දුන්නේ එහෙයිනි." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

උතුම් සහාබාවරු තෑගිබෝගවලින් අල්ලාහ්ගේ දූතයාණාන්ව සැනසීමට ප්‍රිය කළෝය. පොදුවේ නබිතුමාණෝ එවැනි තෑගි පිළිගෙන ඒවා වෙනුවෙන් තුති පුද කරන්නෙකු වූහ.

හජ් ගමනේදී අල්-සඃබ් බින් ජස්සාමා නම් මිනිසෙකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණි අතර, ඔහු නබිතුමාණන් අනුභව කිරීම සඳහා එතුමාණන් වෙනුවෙන් දඩයම් කළ සතෙකු තෑග්ගක් වශයෙන් ලබා දුන්නේය. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ඉහ්රාම් තත්ත්වයේ සිටි බැවින් එතුමාණෝ එය ප්‍රතික්ෂේප කළහ.

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ තෑග්ග ආපසු ලබා දුන් විට, ඔහු ශෝකයට පත් වූ අතර, නිදහසට කරුණ ඉදිරිපත් කර, හේතුව පැහැදිලි කිරීමට නබිතුමාණෝ යුහුසුළු වී මෙසේ පැවසූහ: "සැබැවින්ම අපි ඉහ්රාම් තත්ත්වයේ සිටින්නෙමු. අපි එය ඔබට නැවත ලබා දුන්නේ එහෙයිනි."

ෂෙයිතාන්ගේ මාර්ගය අවහිර කිරීම පිණිස හේතු පැහැදිලි කිරීමට සහ නිදහසට කරුණු පැහැදිලි කිරීමට මූලිකත්වය ගැනීමේ වැදගත්කම මෙයින් අප උගත යුතු පාඩම වේ. උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කර ඇත: "තවද වඩාත් අලංකාර වනුයේ කුමක් ද එය පවසන්නැයි මාගේ ගැත්තන්හට නුඹ පවසනු. නියත වශයෙන්ම ෂෙයිතාන් ඔවුන් අතර බෙදුම් ඇති කරයි. නියත වශයෙන්ම ෂෙයිතාන් මිනිසාට ප්‍රකට සතුරෙකු විය." (අල් ඉස්රා: 53)

කෙනෙකුගේ සිතුවිලි සමනය කිරීම, සිත පිරිසිදු කිරීම සහ නිදහසට කරුණු පැහැදිලි කිරීම සදාචාරයේ ගුණාංග අතරින් වන බව පෙන්වීමේ අරමුණින් විශාරද අන්-නවවිතුමා මෙම හදීසය "රියාලුස්සා සාලිහීන්" නමැති ග්‍රන්ථයෙහි යහපත් හැසිරීම් පිළිබඳ පරිච්ඡේදයේ සඳහන් කොට ඇත.

# 20

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව හුදෙයිෆා බින් අල්යමානි (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඕපාදූප කියමින් සැරිසරන අයකු ස්වර්ගයට ප්‍රවේශ වන්නේ නැත."** (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

මෙම නබිවදන දිවෙන් ඇතිවන අන්ත්‍රාවන් ගැන අපට අනතුරු අඟවන නබිවදන් වලින් එකකි. දිවේ අන්ත්‍රාවන් බොහෝය. විවිධය. කේලාම් කීම සහ ඕපාදූප කීම ද ඒවා අතරිනි.


විශාරද නවවිතුමා මෙසේ පැවසීය: (මෙම ගති ලක්ෂණ දෙක - කේලාම් කීම සහ ඕපාදූප කීම - වඩාත් ම අවලස්සන ගතිගුණ වේ. එමෙන් ම මිනිසුන් අතර වඩාත් පුළුල් ව ඒවා පැතිරී ඇති බව අප දැන ගත යුතුයි. මිනිසුන්ගෙන් කිහිප දෙනෙකු හැර අනෙකුත් සියලු ම දෙනා ඒ ගතිගුණ වලින් ප්‍රවේසම් නො වෙති.

මෙම හදීසයේ, අපගේ නබිතුමාණන්, බරපතල පාපයක් ලෙස සැලකෙන පාපයක් පිළිබඳ දන්වා එයින් වළක්වමින් අනතුරු අඟවා ඇත. එම පාපය නම් ඕපාදූප කීම වේ.

ඕපාදූප කීම යනු: මිනිසුන් අතර අර්බුදයක් ඇති කිරීම පිණිස තොරතුරු සම්ප්‍රේෂණය කිරීමයි. එය මිනිසුන් අතර ගැටළු, ආරවුල් සහ එදිරිවාදිකම්

ඇති කිරීමට හේතු වේ.

ඕපාදූප කීම ගැන ප්‍රවේසම් වීම හා ඒ පිළිබඳ අන් අයට අනතුරු ඇඟවීම ගැහැනු පිරිමි සෑම මුස්ලිම්වරයකු ට ම අනිවාර්ය වේ. මන්ද එය ස්වර්ගය අහිමි වීමටත් එමෙන් ම මිනී වලෙහි වධ හිංසාවට ලක් වීමටත් හේතුවක් වන බැවිනි. (අල්ලාහ් අපව එයින් ආරක්ෂා කරත්වා!)



# 21

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අනස් බින් මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවර හෝ මුස්ලිම්වරයකු යම් ගසක් සිටුවන්නේ ද නැතහොත් යම් වගාවක් වගා කරන්නේ ද -එයින් හට ගත් බෝග වලින්- යම් පක්ෂියකු හෝ මිනිසකු හෝ සතෙකු හෝ අනුභව කරන්නේ නම් එය ඔහුට පුණ්‍ය කර්මයක් වනවා මිස නැත."**
**(මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

කෘෂිකර්මාන්තය වැදගත් මානුෂීය කාර්යයකි; ආහාර පාන ලැබීමට මෙන්ම ධනය ලැබීමට ද එය හේතුවක් වේ.

මුස්ලිම්වරයෙකු වපුරන යම් බීජයක් එයින් පුද්ගලයෙකු, කුරුල්ලෙකු හෝ සතෙකු අනුභව කරන්නේ නම්, වපුරන්නාට පුණ්‍යකර්මයක් අල්ලාහ් ලියන්නේය. මෙම වපුරන්නා මුලින් රෝපණය කර ඇත්තේ පුණ්‍ය කටයුතු සඳහා නොව ආහාර හෝ වෙළඳාම සඳහා වුව ද අල්ලාහ් එසේ ලියනු ඇත. මෙය තම ගැත්තන් කෙරෙහි දක්වන අල්ලාහ්ගේ කරුණාව හේතුවෙනි.

තවද මෙම කාරණය ගස් සිටවීමට පමණක් සීමා නොවේ. මක්නිසාද යත් මුස්ලිම්වරයෙකු කරන සෑම යහපත් ක්‍රියාවක්ම ඒවා වෙනත් අයෙකුට ප්‍රතිලාභයක් ලබා දෙන්නේ නම් එයින් ඔහුට කුසල් ලැබෙනු ඇත. යමෙක් ළිඳක් හාරා එයින් මිනිසෙක්, පක්ෂියෙක්, සතකු හෝ පානය කළේ නම් එසේ නැතහොත් සෙවනැල්ල ලබා ගැනීම පිණිස යම් ස්ථානයක් ඉදි කර එයින් මිනිසෙක්, පක්ෂියෙක් හෝ සතකු සෙවණ ලබා ගත්තේ

නම් ඔහුට ඒ සඳහා කුසලක් හිමි වේ. අනෙකුත් ප්‍රයෝජනවත් හා යහපත් ක්‍රියාවන් සියල්ල ද මේ අයුරින් පිහිටනු ඇත.



# 22

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) පුද්ගලයකුට ණය වී සිටියහ. එබැවින් ඔහු ණය ගෙවන ලෙස ඉල්ලා එතුමාණන් වෙත පැමිණ දැඩි ලෙස කටයුතු කළේය. එය දුටු ධර්ම දූතයාණන්ගේ සහගාමීහු එම පුද්ගලයාට හානියක් කිරීමට තැත් කළෝය. එවිට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: ඔහු අත්හරින්න. අයිතිය දරන්නාට අයිතිය ඉල්ලා සිටීමට උරුමය ඇත." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්, මිනිසෙකුගෙන් ඔටුවෙකු මිල දී ගෙන, ඒ සඳහා වූ මුදල කාලයකට පසු ඔහුට ලබා දීමට ඔහු සමඟ එකඟ විය.

නියමිත කාලය අවසන් වූ විට, එම පුද්ගලයා නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් මුදල් ලබා ගැනීමට පැමිණ, කෝපයෙන් හඬ නගා කෑ ගසන්නට විය.

ධර්ම දූතයාණන් සමඟ අගෞරවණීය අයුරින් හැසිරෙමින් ඔහු ප්‍රකාශ කළ වචනවලට සවන් දුන් සහාබාවරු කෝපයට පත් වී ඔහුට පහර දීමට සූදානම් වූවෝය. එනමුත් නබිතුමාණෝ: නුඹලා ඔහු අත්හරින්න. අයිතිය දරන්නාට අයිතිය ඉල්ලා සිටීමට උරුමය ඇත." යනුවෙන් ඔවුනට පවසා ඔවුන් වැළක් වූහ. එනම්: ඔහු තම උරුමය ඉල්ලා සිටින තාක් කල්, ඔහුට කතා කිරීමට ද උරුමය ඇත යන්න එහි අදහසයි.

මිනිසුන් සමඟ සිදු කරන අපගේ ගනුදෙනුවල දී අප අනුගමනය කළ යුතු අපට ප්‍රයෝජනවත් වැදගත් පාඩමක් මෙම හදීසයෙන් අපි ඉගෙන ගනිමු. එනම්: පුද්ගලයෙකු ඔහුගේ අයිතිය ඉල්ලා සිටින්නේ නම්, අපි ඔහුට සවන් දිය යුතු ය. ඔහුගේ කතාවට අවධානය යොමු කළ යුතු ය. ඔහු කෝපයෙන් යමක් කතා කළ විට හෝ ශබ්ද නැගූ විට ඔහුට දොස් නොනැගිය යුතු ය.

නබිතුමාගේ ජීවන මඟට අනුව ක්‍රියාත්මක වීමෙන් උරුමයන් ඒවායෙහි නියම උරුමක්කරුවන් වෙත ළඟා වනු ඇත. එමෙන් ම අප අතර ගැටළු, එදිරිවාදී කම් සහ ආරවුල් අඩු වී යනු ඇත.

# 23

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ කතාදා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකු මතුලොව පීඩාවන්ගෙන් අල්ලාහ් ඔහුව මුදවා ගනු ඇතැයි අපේක්ෂා කරන්නේ ද ඔහු ණය ගෙවීමට අපහසු තැනැත්තාට කල් දෙත්වා එසේ නැතහොත් එය ඔහුගෙන් ඉවත්කර තබත්වා!"** (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

නැවත නැගිටුවීමේ දිනය යනු දෙවිඳාණෝ ගැත්තන්ව විනිශ්වය කරන දිනයයි. එදින ඔවුන් පෙර සිදු කළ හොඳ සහ නරක දේ සඳහා ඔවුනට කුලිය ලබා දෙනු ලැබේ. ඔවුන් අතර මතභේද ඇති කර ගත් කරුණු පිළිබඳ තීන්දුව එදින ඔහු ලබා දෙයි. පසුව ඔවුන්ට ස්වර්ගයට හෝ නිරයට පිවිසන මෙන් අණ කරනු ලැබේ.

මෙම ඉමහත් දිනයේ දී සිදු වන විශ්මිත තත්ත්වයන් සහ භීෂණයන් නිසා මිනිසුන්ගේ වේදනාව තීව්‍ර ව පවතී.

මළවුන් කෙරෙන් නැගිටුවන දිනයේ දී එම බිහිසුණු විපත්තිවලින් ඔහුව අල්ලාහ් ගලවා ගැනීමට කවරෙකු අපේක්ෂා කරන්නේ ද ණයකරුවන්ගෙන් ණය නැවත ලබා ගැනීම ප්‍රමාද කරත්වා! නැතහොත් එයින් ඔවුන් ව නිදහස් කරත්වා!

ණය ලබා ගත් අයගෙන් එම ණය නැවත අය කිරීම ප්‍රමාද කිරීම සහ එම ණයෙන් කොටසක් හෝ එහි සම්පූර්ණ ණය ප්‍රමාණය හෝ නිදහස් කිරීම

ඉමහත් ක්‍රියාවක් වේ. එසේ කිරීම මුස්තහබ් නම් ප්‍රියජනක කරුණක් වන අතර එය වාජිබ් නම් අනිවාර්ය කරුණක් නොවේ.

කවරෙකු හෝ ඔබෙන් ණයක් ලබාගෙන පසුව එය අය කළ යුතු කාලය පැමිණ තිබිය දී ඔහුට එම ණය ආපසු ගෙවිය නො හැකි බව ඔබ දැන ගන්නේ නම් ඔහුට යම් කාල අවකාශයක් ලබා දෙන්න. නැතහොත් ඔහුට සමාව දී ඔබේ අයිතිය සම්පූර්ණ ව හෝ ඉන් කොටසක් මුදවා හරින්න. ඔබ එසේ කරන්නේ නම්, ඔබ විශාල යහපතක් මත සිටිනු ඇත. නැවත නැගිටුවීමේ දිනයෙහි විපත්තිවලින් ගැලවී ස්වර්ගය දිනා දෙවිඳාණන්ගේ තෘප්තිය ද ලබා ගැනීමට එමගින් ඔබට හැකි වේ.

# 24

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෛයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකු අපට වංචා කළේ ද ඔහු අප අතරින් කෙනෙකු නොවේ." (මූලාශ්‍රය: මුස්ලිම්)

## විවරණය

වරක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නගරයේ එක් වෙළඳ පොළක ඇවිදිමින් සිටියහ. එවිට, එතුමාණෝ තිරිඟු වැනි ආහාර ගොඩක් විකුණන මිනිසෙක් පසුකර ගියහ. වර්ෂාව නිසා එම ආහාර ද්‍රව්‍ය තෙත් ව තිබුණි. එබැවින් එම මිනිසා එම තෙත් බව වසන් කර, මිනිසුන් හට නොපෙනෙන අයුරින් එය පතුලේ සඟවා තැබීය.

නබි තුමාණන්ට මෙම භාණ්ඩයේ යම් දෝෂයක් ඇති බව දැනුණු බැවින් එම ආහාරය තුළට අත දමා බැලූ කල්හි එය තෙත් වී ඇති බව දැනුණි. පසුව එතුමාණන් ඒ මිනිසාට තරවටු කර....

"මිනිසුන්ට පෙනෙන පරිදි ඔබ එය උඩින් තැබිය යුතු නොවේද ? "කවරෙකු අපට වංචා කළේ ද ඔහු අප අතරින් කෙනෙකු නොවේ." යනුවෙන් ප්‍රකාශ කළහ.

විකුණුම්කරු තම ගනුදෙනුවල දී පැහැදිලි සහ අවංක විය යුතු අතර, ඔහු ප්‍රශංසාවට නුසුදුසු නිෂ්පාදනයක් ගැන පුහු ලෙස ප්‍රශංසා නොකර සිටිය යුතුයි. ගැනුම්කරුවන්ට එය මිලදී ගැනීමෙන් වළක්වන යම් අඩුපාඩුවක්

එම භාණ්ඩයේ තිබුණේ නම් එය නොසැඟවිය යුතුය. ඔහුගේ භාණ්ඩයේ මිල අසාධාරණ ලෙස ඉහළ නොදැමිය යුතුය.

තවද මෙම හදීසයේ වංචා කිරීම යන මෙම නින්දිත පාපය සහ පිළිකුල් සහගත ගතිගුණ දැඩි ලෙස තහනම් කර ඇත. මෙම හදීසය එම පාපයෙන් වැළකී සිටින ලෙසත් එයින් පරිස්සම් වන ලෙසත් මිනිසුන්ගෙන් ඉල්ලා සිටී. මුස්ලිම්වරයෙකුට ඔහුගේ වෙළඳාමේ දී ඔහුගේ රැකියාවේ දී ඔහුගේ අධ්‍යයන කටයුතුවල දී හෝ ඔහුගේ වෙනත් ඕනෑම කටයුත්තක දී වංචා කිරීමට අවසර නැත.

# 25

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ උමාමා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකු තවත් මුස්ලිම්වරයකුගේ උරුමයක් දිවුරුමක් මගින් අසාධාරණ ලෙස තමන් සතු කර ගත්තේ ද ඔහුට අල්ලාහ් නරකාදිය අනිවාර්ය කරනු ඇත. තවද ඔහුට ස්වර්ගය තහනම් කරනු ඇත. එවිට පුද්ගලයකු: අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! එය ස්වල්ප ප්‍රමාණයක් වුව ද? යැයි ප්‍රශ්න කළේය. එතුමා: අරාක් නම් ගසක කෝටු කැබැල්ලක ප්‍රමාණයක් වුවද එසේය යැයි පිළිතුරු දුන්හ."** (මූලාශ්‍රය: මුස්ලිම්)

## විවරණය

ඉස්ලාමීය නීතිය වඩාත් සැලකිලිමත් වන කරුණු අතර මානව අයිතිවාසිකම් ද වේ.

කිසිවෙකුගෙන් හෝ ඔහුට හිමි කිසිදු අයිතිවාසිකමක් පැහැර ගැනීමට අපට අවසර නැත. එය මුදල් හෝ වෙනත් දෙයක් හෝ වේවා!

මෙම හදීසයේ, නබි තුමාණන්, මිනිසුන්ගේ අයිතිවාසිකම් කඩ කිරීම පිළිබඳ අපට අනතුරු අඟවා ඇති අතර බොරු දිවුරුමකින් මුස්ලිම්වරයකුගේ අයිතිවාසිකම් ලබා ගන්නේ නම් ඔහුගේ දඬුවම අපායට ඇතුළු වීම සහ ස්වර්ගයට ඇතුල් වීම තහනම් වීම වේ යැයි අවධාරණය කර ඇත.

තවද නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ සහගාමීන් මෙම කියමනට සවන් දුන් විට, "අල්ලාහ්ගේ දූතයාණනි! එය ස්වල්ප ප්‍රමාණයක් වුව ද? යැයි ඔවුහු විමසා සිටියෝය. එනම් මානව අයිතිවාසිකම් ස්වල්ප ප්‍රමාණයක් හෝ කඩ කරන අයත් මේ දඬුවමට

ඇතුළත් වන්නේ ද? යන්නයි. එවිට "අරාක් නම් ගසක කෝටු කැබැල්ලක ප්‍රමාණයක් වුවද එසේය" යැයි නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ පිළිතුරු දුන්හ.

එනම් මිනිසුන්ගේ මුදල් ගසා කෑම හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් කඩ කිරීම යනු ඉමහත් වරදකි. එය අරාක් නම් ගසක කෝටු කැබල්ලක් මෙන් සුළු ප්‍රමාණයක් වුවද මහා වරදකි.

# 26

අබූ මූසා අල් අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ එතුමා ව සහ මුආද් (රළියල්ලාහු අන්හු) තුමාව යෙමනය වෙත යවා තබන අවස්ථාවෙහි ඔවුන් දෙදෙනාට මෙසේ උපදෙස් දුන්හ. ඔබ දෙදෙනා පහසු කරන්න. අපහසු නොකරන්න. ශුභාරංචි දන්වන්න. පලවා නොහරින්න. එකමුතු වන්න. විරුද්ධ නොවන්න." (මූලාශ්‍රය: බුහාරී හා මුස්ලිම්)

## විවරණය

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ ආගම ව්‍යාප්ත කිරීම සහ මිනිස්සුනට ඉගැන්වීම පිණිස අබූ මූසා අල්-අෂ්අරි සහ මුආද් ඉබ්න් ජබල් යන ශ්‍රේෂ්ඨ සහගාමීන් දෙදෙනෙක් යෙමනය වෙත යැවූහ.

ඔවුන් ගමන් කිරීමට පෙර, නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් කෙටි දේශනයක් කළ නමුත් එය විශිෂ්ට හා හැඟීම්බර විය.

"ඔබ දෙදෙනා පහසු කරන්න. අපහසු නොකරන්න" මෙහි අර්ථය: මිනිසුන් සමඟ ඔබ දෙදෙනා කාරුණිකව කටයුතු කරන්න. අසීරුතාවක් හෝ දුෂ්කරතාවක් ඇති නොවන පරිදි දෙවිඳාණන්ගේ ආගම දන්වා සිටින්න. ආගම පහසු බවත් එහි දුෂ්කරතාවයක් හෝ අපහසුතාවයක් හෝ නොමැති බවත් ඔවුනට දැනුම් දෙන්න යන්න වේ.

"ශුභාරංචි දන්වන්න. පලවා නොහරින්න" එනම්: මිනිසුන්ට දෙවිඳාණන්ගේ වරප්‍රසාද පිළිබඳ ශුභාරංචි දන්වා සිටින්න. ඔහු සතුව ඇති දේ කෙරෙහි ඔවුන් තුළ ආශාවක් ඇති කරන පරිදි මිනිසුන් සමඟ කතා

කරන්න. එමෙන්ම දේවත්වය විශ්වාස කිරීමෙන් සහ යහපත සිදු කිරීමෙන් ඔවුන් වැළකී සිටින පරිදි ඔවුන් සමඟ කතා නොකරන්න.

ඉන්පසු එතුමාණන් ඒ සහෝදර හෝ මිතුරු දෙදෙනාට තුන්වන වැදගත් උපදෙසක් ලබා දෙන ලදී. එනම්: **"එකමුතු වන්න. විරුද්ධ නොවන්න."** එනම්, ඔබ එකිනෙකාට කීකරු විය යුතුය.

ඔබගෙන් කෙනෙකු තම සහගාමියා යම් කාරණයක් ගැන උනන්දුවෙන් සිටිනු දුටුවහොත් ඒ පිළිබඳ ඔබ විරුද්ධ නොවන්න. එමඟින් ආදරය, මිත්‍රත්වය සහ හුරුපුරුදුකම අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි වේ.

මෙයින් අපි වැදගත් දෙයක් ඉගෙන ගනිමු. තම මිතුරන්ට කීකරු වන සහ හැකි තරම් ඔවුන්ට විරුද්ධ නොවන මිතුරා සුන්නාහ්ව අනුව කටයුතු කරන්නෙකු වේ. එකඟ නොවීම්, මතභේද සහ විරුද්ධතා බහුලව ඇති තැනැත්තා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සුන්නාහ්වෙන් බොහෝ දුරස් අයෙකු වේ.

# 27

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ මූසා අල් අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "කවරෙකු අපට එරෙහිව ආයුධයක් ඔසවන්නේ ද ඔහු අප අතරින් අයෙකු නොවේ."** (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

ආරක්ෂාව යනු සර්වබලධාරී දෙවිඳාණන්ගේ මහත් ආශිර්වාදයක් වන අතර එය ජීවිතයේ අත්‍යවශ්‍ය කරුණු අතරින් එකකි.

දෙවිඳාණන් තම ගැත්තන් කෙරෙහි ආරක්ෂාව නමැති ආශීර්වාදය ලබා දී ඇති බව අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: "මෙම නිවසේ පරමාධිපතිට ඔවුන් නැමදුම් කරත්වා ! කුසගින්නෙන් (සිටි) ඔවුනට ආහාර පිරිනමා බියෙන් (සිටි) ඔවුනට ආරක්ෂාව පිරිනැමුවේ ඔහුය." (කුරයිෂ්: 3-4)

සමාජයේ ආරක්ෂාව තහවුරු කිරීමේ වැදගත්කම ඇඟවීම පිණිස මිනිසුන් බිය ගැන්වීමට, ඔවුන් අතර භීතිය පතුරුවා හැරීම සහ මරණ තර්ජන එල්ල කිරීමට ආයුධ අතට ගැනීම යනාදී කරුණු වලින් වළකින ලෙස නබි තුමාණන් අනතුරු ඇඟවීය. මෙයට පාලකයින්ට එරෙහිව කැරලි ගැසීම, ඔවුනට යටත් නොවීම, සහ ප්‍රජාවෙන් වෙන්වීම යන කරුණු ද ඇතුළත් වේ.

තවද, "කවරෙකු අප මත ආයුධයක් ඔසවන්නේ ද ඔහු අප අතරින්

අයෙකු නොවේ." යන ප්‍රකාශය, ඉහත සඳහන් කරුණු වෙනුවෙන් ආයුධ අතට ගන්නා ඕනෑම අයෙකු එතුමාගේ අනුගාමිකයෙකු නොවන බවට සාක්ෂියකි. එමෙන් ම මෙම වරද මහා පාපයන් අතරින් එකකි.

# 28

**අබ්දුල්ලාහ් බින් මුගෆ්ෆල් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) අතින් ගල් කැට විසි කිරීම තහනම් කළහ. මන්ද එය යම් සතෙකු දඩයම් නොකරයි. සතුරකු තුවාල නොකරයි. එනමුත් එය දත කඩා දමනු ඇත. ඇස් ගලවනු ඇත." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මිනිසුනට ප්‍රයෝජනවත් දෑ ඉගැන්වීමට සහ ඔවුන්ගේ ආගමික හා ලෞකික කාරණාවලදී ඔවුනට හානියක් වන දේ ගැන අනතුරු ඇඟවීමට උනන්දු විය. සර්වබලධාරී දෙවිඳාණන් එතුමා ප්‍රශංසා කරමින් මෙසේ සඳහන් කර ඇත: "නුඹලා අතරින් වූ ධර්ම දූතයකු නුඹලා වෙත සැබැවින්ම පැමිණ ඇත. නුඹලා දුෂ්කරත්වයට පත්වීම ඔහු වෙත බැරෑරුම්ය. ඔහු නුඹලා කෙරෙහි (නුඹලාගේ විශ්වාසය පිළිබඳ) සතුටු වන්නෙකි. දේව විශ්වාසවන්තයින් පිළිබඳ සෙනෙහෙවන්ත වූ මහා කාරුණිකය." (අත් තව්බා: 128)

තවද මෙසේ සඳහන් කර ඇත: "විශ්වාසවන්තයින් මීට පෙර පැහැදිලි නොමඟෙහි සිටිය ද තම(අල්ලාහ්ගේ) වදන් ඔවුනට කියවා පෙන්වන තවද ඔවුන් ව පිවිතුරු කරවන තවද ඔවුනට ග්‍රන්ථය(කුර්ආනය) හා ඥානය උගන්වන රසූල්වරයෙකු ඔවුන් අතරින් ම ඔවුන් වෙත එවීමෙන් ඔවුනට අල්ලාහ් උපකාර කළේය." (ආලු ඉම්රාන් 164)

මෙම හදීසයේ, නබි තුමාණන්, ඉස්ලාමයට පෙර යුගයේ සහ ඉස්ලාම්හි

ආරම්භ කාල වකවානුවේ ඇතමුන් විසින් කරන ලද කරුණක් වන ගල් කැට විසි කිරීම යන ක්‍රියාව තහනම් කර ඇත. මන්ද මෙයින් කිසිදු ප්‍රයෝජනයක් ඇති නොවේ. එය දඩයම් කරන සතාව මරා නොදමයි. එමෙන්ම සතුරා පරාජය ද නොකරයි. නමුත් එය දතට වැදුණේ නම් එම දත කඩා දමයි. ඇසට වැදුණේ නම් ඇසට හානි කරයි යනුවෙන් පවසමින් නබි තුමාණෝ එහි තහනමට හේතුව පැහැදිලි කළහ.

මෙම තහනම වැඩිහිටි සහ කුඩා දරුවන් යන සියල්ලන් සඳහා පොදු වේ. නමුත් මේ පිළිබඳ කුඩා දරුවන්ට -ඔවුන් අතර ගල් කැට විසි කර සෙල්ලම් කිරීමේ පුරුද්දක් ඇති බැවින්- මතක් කර දීමේ අවශ්‍යතාව බහුලය. එබැවින් ඒ පිළිබඳ අපි ඔවුන්ට උපදෙස් දිය යුතුය. ඔවුන්ව මෙහෙයවිය යුතුය. ඔවුනට ඉගැන්විය යුතුය.

# 29

**අනස් බින් මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට වසර දහයක් මම සේවය කර ඇත්තෙමි. එතුමාණන් මාහට කිසිදාක චී යනුවෙන් හෝ පවසා නැත."** (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මක්කාවෙන් හිජ්රත් (සංක්‍රමණය) වී මදීනාවට පැමිණි විට, අනස් බින් මාලික්තුමාගේ මෑණියන් අනස් බින් මාලික්තුමාවත් රැගෙන (එවිට අනස් බින් මාලික්ගේ වයස දහයකි) නබිතුමාණන් වෙත පැමිණ "අල්ලාහ්ගේ දූතයාණනි! මේ මාගේ පුත්‍රයා වන අනස් ය. මම ඔහුව ඔබ වෙත ගෙන ආවේ ඔහු ඔබට සේවය කිරීම පිණිසය." යැයි පැවසුවාය. නබි (සල්) තුමාණෝ ඔහුව පිළිගත්හ.

තවද එදින සිට අනස් තුමාණන් නබි (සල්) තුමාණන්ගේ සේවකයකු ලෙස සේවය කළ අතර එතුමාගේ අවශ්‍යතා සහ කටයුතු බොහොමයක් ඉටු කර සේවයේ නිරත විය. ඇතැම් විට කටයුතු කිහිපයක් පමණක් ඉතිරි වේ.

මෙම හදීසයේ අනස් (සල්) තුමාණන් නබි (සල්) තුමාණන්ගේ සදාචාරය ගැන අපට පවසන අතර, ඔහු නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට අඛණ්ඩව වසර දහයක් කරන ලද සේවය ගැන අපට මතක් කර දෙයි. එම දීර්ඝ කාලය තුළ ඔහු නබිතුමාගෙන් නින්දාසහගත,

අපහාසාත්මක් වචනයක් පවා එතුමාගෙන් අසා නැත.

මෙය නබි (සල්) තුමාණන්, එතුමාගේ සගයින් - ඔවුන් බාල හෝ මහලු හෝ, ඔවුන් සේවකයෝ හෝ පාලකයෝ හෝ වේවා ඒ- සියල්ලන් සමඟ කටයුතු කළ විශිෂ්ට සාරධර්ම හා විශිෂ්ට ආචාර ධර්ම පෙන්නුම් කරනු ඇත.

මෙම හදීසයෙන් අප උගත යුතු පාඩම වනාහි: අප, අප භාරයේ සිටින සේවකයින්ට සහ කම්කරුවන්ට කරුණාවන්ත විය යුතුයි. එය ආගමානුගත කළ කරුණකි. ඔවුන් අප වැනි මිනිසුන් වන අතර, ඔවුන්ට ගරු කිරීම, ඔවුන් අගය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දීම ඔවුන් වෙත වූ අපගේ යුතුකම් වේ.

# 30

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබෙන් කවරෙකු හෝ ඔහු අසුන්ගත් තැනින් නැගිට ඒ වෙත නැවත පැමිණියේ නම් ඒ තැනට වඩාත් සුදුසු වන්නේ ඔහු ම ය." (මූලාශ්‍රය: මුස්ලිම්)**

## විවරණය

අපේ දහම පරිපූර්ණ දහමකි. එය අපට මෙලොව සහ පරලොව ප්‍රයෝජන ගෙන දෙන කුඩා හෝ විශාල සියලු කරුණු අපට පැහැදිලි ව හා විස්තරාත්මක ව කියා දී ඇත.

මෙම හදීසයෙන් එතුමාණන් අපට පැහැදිලි කළේ එවැනි රැස්වීමක හෝ සභාවක හෝ පිළිපැදිය යුතු ආචාර ධර්මයකි.

එනම්: යම් පුද්ගලයෙක් යම් ස්ථානයක වාඩි වී ඉන් නැගිට ඒ වෙත ආපසු පැමිණියේ නම්, ඔහුට ඒ ස්ථානය කෙරෙහි වැඩි අයිතියක් හා සුදුසුකමක් තිබේ. වෙනත් කෙනෙකු එහි අසුන් ගැනීමට අවසර නැත. එබැවින් ඔහු ආපසු පැමිණියේ නම්, ඒ ස්ථානයට සුදුසු ම පුද්ගලයා ඔහු වේ.

පොදු රැස්වීම් හෝ සභාවන්, දේවස්ථාන, ශිල්පය හදාරන තැන්, පන්ති කාමර, හෝ එවැනි ම වෙනත් ස්ථාන යනාදී ස්ථාන මෙයට ඇතුළත් වේ.

කවරෙකු හෝ අසුනෙන් නැගිට ටික වේලාවකට පසු නැවත ඒ වෙත

පැමිණෙන්නේ නම්, ඔහු ඒ අසුනට වඩාත් සුදුසු ය. නමුත් ඔහු නැඟිට දිගු වේලාවකට පසු නැවත ඒ වෙත පැමිණිණෙන්නේ නම් - උදාහරණයක් ලෙස: උදේ වරුවේ නැඟිට දහවල් වේලාවේ දී හෝ පසුදා හෝ ඒ වෙත ආපසු පැමිණෙන්නේ නම්- ඔහුට ඒ ස්ථානය කෙරෙහි අයිතියක් හෝ සුදුසුකමක් හෝ නොමැත.

සටහන: බොහෝ ආරවුල් (බහුලව පිරිමි ළමුන් අතර) විශේෂයෙන් නිවාසවල සහ පාසැල් වල අසුන් ගන්නා ස්ථාන හේතුවෙන් ඇති වේ.

අපි අපගේ රැස්වීම්වලදී ආගමික ආචාරධර්ම පිළිපදින්නේ නම් අප අතර සමීපත්වය වර්ධනය වී අප අතර විරුද්ධත්වය අඩු වේ.

# 31

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "මුස්ලිම්වරයකු මත පැවරෙන තවත් මුස්ලිම්වරයකු සඳහා වූ යුතුකම් හයකි. ඔහු හමු වූ විට ඔහුට සලාමය පවසන්න. ඔබට ඇරයුම් කළ විට, එයට පිළිතුරු දෙන්න. ඔහු ඔබෙන් උපදෙස් පැතූ විට ඔහුට උපදෙස් දෙන්න. ඔහු කිවිස අල්හම්දු ලිල්ලාහ් යැයි පැවසූ විට ඔහුට යර්හමුකල්ලාහ් යැයි පවසන්න. ඔහු රෝගාතුර වූ විට ඔහුගෙන් සුව දුක් විමසන්න. ඔහු මරණයට පත් වූ විට, ඔහුගේ (ජනාසාව) පසුපස යන්න." (මූලාශ්‍රය: මුස්ලිම්)**

## විවරණය

මුස්ලිම්වරයෙකුට තවත් මුස්ලිම්වරයෙකු කෙරෙහි බොහෝ යුතුකම් ඇත. ඒවායින් වඩාත් වැදගත් වන්නේ මෙම හදීසයේ සඳහන් යුතුකම් හයයි.

**පළමු යුතුකම:** සලාමය පැවසීම: ඔබ ඔබේ සහෝදරයා මුණගැසෙන්නේ නම්, ඔහුට සලාම් පවසන්න, ඔහු ඔබට සලාම් පැවසුවේ නම්, පිළිතුරු වශයෙන් ඔබ ද ඔහුට සලාම් පවසන්න.

**දෙවන යුතුකම:** ඇරයමුට පිළිතුරු දීම: ඔහු ඔබට ආරාධනා කරන්නේ නම්, ඔහුගේ ආරාධනයට ප්‍රතිචාර දක්වන්න. විශේෂයෙන් ඔහු ඔබට මංගල උත්සවයකට ආරාධනා කරන්නේ එයට සහභාගී වීම ඉතා වැදගත් හා අනිවාර්ය වන කරුණකි.

**තුන්වන යුතුකම:** උපදෙස් ලබා දීම; ඔබේ සහෝදරයා ඔබෙන් උපදෙස් ඉල්ලන්නේ නම් හෝ යමක් ගැන ඔබෙන් විමසන්නේ නම්, ඔහුට අවශ්‍ය උපදෙස අවංකව පවසන්න.

**සිව්වන යුතුකම:** යර්හමුකල්ලාහ් යැයි පැවසීම; ඔබේ සහෝදරයා කිවිසුම් අරින විට අල්හම්දු ලිල්ලාහ් යැයි පවසා දෙවිඳාණන්ට ප්‍රශංසා කරන්නේ නම්, ඔබ ද යර්හමුකල්ලාහ් (දෙවිඳාණන් ඔබට කරුණා කරත්වා!) යැයි පවසන්න. මෙය ඇසූ ඔහු යහ්දීකුමුල්ලාහ්, වයුස්ලිහු බාලකුම් (අල්ලාහ් ඔබට ද යහමග පෙන්වත්වා! ඔබේ කරුණ නිවැරදි කරත්වා!) යැයි පැවසිය යුතුයි.

**පස්වන යුතුකම:** සුව දුක් විමසීම; ඔබේ මුස්ලිම් සහෝදරයා රෝගාතුරු වූ විටක, ඔහුගේ සුවදුක් විමසීම සඳහා ඔහු වෙත යා යුතුයි. ඔබේ පැමිණීම ඔහු තුළ විශාල බලපෑමක් ඇති කරන බවත්, දෙවිඳාණන් වෙතින් ඉමහත් චේතනයක් ඔබට ලැබෙන බවත් ඔබ දැන ගත යුතුයි.

**හයවන යුතුකම:** ඔහුගේ (ජනාසාව) පසුපස යෑම; මුස්ලිම්වරයෙකුගේ මරණයෙන් පසුව ද ඔහුගේ යුතුකම් දිගටම පවතී. ඔහු මිය ගියහොත් ඔහුගේ ජනාසාව පසුපස යා යුතු ය. එනම්, ඔහු වෙනුවෙන් කෙරෙන ජනාසා සලාතය සඳහා සහභාගී විය යුතුයි. පසුව ඔහු භූමදාන කරන සුසාන භූමියට යා යුතුයි. මෙය ඉමහත් සේ කුසල් ලබා දෙන යහපතකි; මෙසේ සිදු කිරීමෙන් මිය ගිය තැනැත්තා වෙනුවෙන් යහපත ප්‍රාර්ථනා කිරීම ද ජීවත් ව සිටින අය සඳහා මහත් ප්‍රතිඵලද හිමි වනු ඇත.

# 32

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ සර්ද් අල්කුද්රි (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලද "මාර්ගයට එහි අයිතිය ලබා දෙන්න. එවිට ඔවුහු : එහි අයිතිය කුමක් ද? යනුවෙන් විමසුවෝ ය. එහි අයිතිය වනාහි: බැල්ම පහත හෙලීම, හිංසාව වළක්වාලිම, සලාමයට පිළිතුරු දීම, යහපත අණ කර අයහපතින් වැළක්වීම වේ" යනුවෙන් නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් පැවසූහ. (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ කාලයේ මිනිසුන් පාරවල් (වීදි) දෙපස රැස් ව සිට එහි අසුන් ගෙන, කතාබස්වල නිරත වෙමින් සිටියෝය. එය දුටු නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ "වීදිවල වාඩි නොවන්න! යනුවෙන් ඔවුන්ට අවවාද කළහ. දෙවියන්ගේ දූතයාණනි! අපට මෙවැනි අසුන් ගැනීම් අවශ්‍යය යැයි එහි සිටි අය පැවුසුවෝය. එවිට නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ. එසේ නම්; "මාර්ගයට එහි උරුමය ලබා දෙන්න. එවිට ඔවුන් : එහි උරුමය කුමක් ද යනුවෙන් විමසුවෝ ය. එවිට මාර්ගයේ උර්මයන් අතරින් මෙම උරුම සතර ඔවුනට හඳුන්වා දුන්හ:

**පළමුවැන්න:** බැල්ම පහත් කිරීම; කවරෙකු හෝ මාර්ගයක අසුන් ගෙන සිටිය දී විවෘත නිවසක් දුටුවේ ද, ඔහු ඒ දෙස නොබලත්වා, එපරිදිම, කවරෙකු මාර්ගයේ ගමන් කරන කාන්තාවක් දුටුවේ ද ඔහු ඔහුගේ බැල්ම පහත හෙළත්වා! උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "දෙවියන් ගැන විශ්වාස කරන පුරුෂයින්හට ඔවුන්ගේ බැල්ම පහත හෙළන මෙන්ද

ඔවුන්ගේ ලිංගේන්ද්‍රියන් ආරක්ෂා කරන මෙන් ද නුඹ පවසනු. එය ඔවුනට වඩාත් පිවිතුරු වනු ඇත. නියත වශයෙන්ම අල්ලාහ් නුඹලා සිදු කරන දෑ පිළිබඳ ව අභිඥානවන්තය." (අන් නූර්: 30)

**දෙවැන්න:** හිංසාව වළක්වාලිම: එනම්, මාර්ගය අවහිර නොකිරීමෙන්, මිනිසුන්ට හානි කරන අපද්‍රව්‍ය, අපිරිසිදු ද්‍රව්‍ය එයට නොදැමීමෙන් ය.

**තුන්වැන්න:** සලාමයට පිළිතුරු දීම; කවරෙකු හෝ සලාම් කියන්නේ නම්, වාඩි වී සිටින අය පිළිතුරු වශයෙන් නැවත වරක් ඔවුනට සලාම් පැවසිය යුතුයි. මුලදී සලාමය පැවසීම සුන්නාවක් වන අතර එයට පිළිතුරු දීම අනිවාර්ය වන්නේය. මක්නිසාදයත් සර්වබලධාරී දෙවියන් වහන්සේ මෙසේ පවසයි. "සුබ පැතුමකින් නුඹලා සුබ පතනු ලැබූ විට නුඹලා ද ඊට වඩා අලංකාර ලෙසින් සුබ පතනු. එසේ නැතහොත් එයම ප්‍රතිචාර ලෙස දක්වනු. සැබැවින්ම අල්ලාහ් සියලු දෑ කෙරෙහි අවධානය කරන්නාය." (අන් නිසා : 86)

**සිව්වැන්න:** යහපත අණ කර අයහපත වැළක්වීම; දේවත්වය විශ්වාස කරන්නන් ව අල්ලාහ් ප්‍රශංසා කර ඇත්තේ යහපත අණ කර අයහපත වළක්වන හේතුවෙනි. ඒ ගැන සර්වබලධාරි මෙසේ පවසයි: "(දේව) විශ්වාසවන්තයෝ හා දේව විශ්වාසවන්ත කාන්තාවෝ ඔවුන්ගෙන් ඇතැමෙකු ඇතැමෙකුගේ සමීප මිතුරන් වෙති. ඔවුහු යහපත් දේ නියෝග කරන අතර පිළිකුල් සහගත දෙයින් වළක්වති. සලාතය විධිමත් ලෙසින් ඉටු කරති. සකාත්ද පිරිනමති. තවද අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට අවනත වෙති. අල්ලාහ් කරුණාව පෙන්වන අය මොවුහුය. නියත වශයෙන්ම අල්ලාහ් සර්ව බලධාරීය. සියුම් ඥානය ඇත්තාය." (අත් තව්බා: 71)

# 33

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "අන්තිම කැමැත්ත ප්‍රකාශ කිරීමට යම් වස්තුවක් හිමි ව ඇති කවර මුස්ලිම් වරයෙකු වුව ද ඔහුට තම අන්තිම කැමැත්ත නොලියා රාත්‍රී දෙකක් ගත කිරීමට පවා අනුමැතිය නැත." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

අන්තිම කැමැත්ත ලබා දිමට යමක් ඇති කෙනෙකුට ඒ පිළිබඳ නීත්‍යානුකූලභාවය මෙම හදීසයෙන් පෙන්නුම් කරයි.


යමෙක් ණය වී ඇත්නම් හෝ ඔහු නො ගෙවූ සකාත් තිබේ නම් හෝ ඔහුට භාරයක්, තැන්පතුවක් හෝ වෙනත් වගකීමක් තිබේ නම්, ඔහු විෂයයෙහි අන්තිම කැමැත්ත අනිවාර්ය වේ.

ඔහු කෙරෙහි කවර හෝ වගකීමක් නොමැති නම්, අන්තිම කැමැත්ත ලබා දීම ඔහු විෂයයෙහි අනිවාර්ය නොවේ. එනමුත් එවැනි අවස්ථාවක අන්තිම කැමැත්ත ලබා දීම ඔහුට ප්‍රියජනක කරුණකි. ඒ ඔහුගේ මුදලින් තුනෙන් එකක් (හෝ ඊට අඩුවෙන්) පුණ්‍ය ව්‍යාපෘති සහ පුණ්‍ය කටයුතු සඳහා අන්තිම කැමැත්ත ලබා දීමෙනි.

මෙහි දී අවධාරණය කළ යුතු කරුණක් වනාහි: කවරෙකු හෝ සුළු මුදලක් ණයට ගත්තේ නම් හෝ භාණ්ඩයක් මිල දී ගෙන එහි වටිනාකම පසුව ගෙවීමට අදහස් කළේ නම් හෝ මෙවැනි කුඩා කාරණාවල දී පවා අන්තිම කැමැත්ත සිදු කළ යුතුයි. මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ නිතර

නිතර ඇති වන පොදු අවස්ථාවන් හි තත්ත්වය ද මෙයයි.

එමෙන්ම: කැමැත්තට නිශ්චිත සූත්‍රයක් නොමැති නමුත්, අන්තිම කැමැත්ත කරන්නා ඔහුට නිර්දේශ කිරීමට අවශ්‍ය දේ පැහැදිලි සහ තේරුම් ගත හැකි ආකාරයෙන් සටහන් කළ යුතුයි. ඔහු එය කඩදාසියක නැතහොත් විද්‍යුත් තැපෑලක ලියා යැවුව ද දුරකථන පණිවිඩයකින් හෝ ලිවීමකින් තොර ව වාචික ව එය සිදු කළ ද ඒ සියලු ක්‍රම නිවැරදි ය. ඒ සියල්ල ප්‍රමාණවත් ය.



# 34

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබ ඔබේ දෙමව්පියන්ගේ නාමයෙන් දිවුරා සිටීම සැබැවින් ම අල්ලාහ් ඔබට තහනම් කර ඇත. කවරෙකු හෝ දිවුරා සිටින්නෙකු වී නම් ඔහු අල්ලාහ්ගේ නාමයෙන් දිවුරා සිටිය යුතුය. නැතහොත් නිහඬව සිටිය යුතුය." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

සහාබාවරු, ඔවුන් ඉස්ලාම් දහමට නවකයින් ලෙස සිටිය දී, අඥාන කාලයේ දී මෙන්, දෙවිඳාණන් මත හැර වෙනත් අය මත දිවුරන්නට පුරුදුව සිටියහ. ඔවුන් තම පියවරුන්ගේ නාමයෙන්, ඔවුන්ගේ ගෞරවය හා විශ්වාසවන්තභාවය මත සහ වෙනත් ආකාර වලින් දිවුරන්නට වූහ.

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ ඔවුන්ට දෙවිඳාණන් මත හැර වෙනත් අය මත දිවුරා සිටීම තහනම් කළ අතර උමර් (රළියල්ලාහු අන්හු) තුමා මෙම තහනම අසා සිටි අයගෙන් කෙනෙකු විය. එබැවින් එතුමා වහාම ඒ අනුව ක්‍රියාත්මක වූ අතර එතුමා කිසි විටෙකත් වෙනත් අය මත දිවුරා සිටියේ නැත.

අබ්දුල්ලාහ් බින් උමර් (රළියල්ලාහු අන්හු) තුමා මෙම හදීසය ප්‍රකාශ කිරීමෙන් පසු මෙසේ පැවසීය: උමර් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පැවසීය: අල්ලාහ් මත දිවුරා පවසමි! නබිතුමාණන් එය තහනම් කිරීම අසා සිටි දා පටන් මම ඒ අයුරින් දිවුරා නොසිටියෙමි.

දෙවිඳාණන්ගේ අණට නොපැකිලව, කල් දැමීමකින් හෝ පසුබෑමකින් තොර ව ස්ථිරව හා අධිෂ්ඨානශීලී ව පිළිපැදීම මුස්ලිම්වරයෙකුගේ යුතුකමයි:

දෙවිඳාණන් මත හැර වෙනත් අය මත දිවුරා සිටීමේ ක්‍රම තුළ: ඔබේ ජීවිතය මත දිවුරා සිටිමි; නබිතුමා මත දිවුරා සිටිමි; කඃබාව මත දිවුරා සිටිමි යනාදී ලෙස ඇතැමුන් පවසන ප්රකාශ ද ඇතුළත් වේ.

මේ සියල්ල දිවුරුම් දීමේ තහනම් ක්රම වන අතර ඒවා දේවත්වයට ද ආදේශ කිරීමකි.

"නැත, කඃබාව මත දිවුරා සිටිමි! යැයි මිනිසෙකු පවසනු දුටු අබ්දුල්ලා බින් උමර් (රළියල්ලාහු අන්හු) තුමා ඔහුට මෙසේ ප්‍රකාශ කළේය: අල්ලාහ් හැර වෙනත් කිසිවක් මත දිවුරා නොසිටින්න. මන්ද අල්ලාහ්ගේ දූතයාණන් "කවරෙකු දෙවිඳාණන් මත හැර වෙනත් කෙනෙකු මත දිවුරන්නේ ද ඔහු ප්‍රතික්ෂේප කළ අයෙකු වේ නැතහොත් දේවත්වයට ආදේශ කළ අයෙකු වේ" යනුවෙන් පවසනු මම අසා ඇත්තෙමි. (මූලාශ්‍රය: අහ්මද්/ අබූ දාවූද්/ තිර්මිදි), තිර්මිදි (රහ්මතුල්ලාහි අලෙයිහි) තුමා මෙසේ පැවසූහ: මෙය නිවැරදි හදීසයකි. ෂෙයික් අල්-අල්බානි තුමා ද එය තහවුරු කර ඇත.

# 35

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ කිසිදු ආහාරයකට අඩුපාඩු නොකීහ. එය එතුමාණන්ට කැමති වී නම් එතුමාණෝ අනුභව කළහ. නැතහොත් එය අත්හැර දැමූහ." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ උතුම් සදාචාරයෙන් පිරිපුන් අයෙකු වූහ. යහපත්, අලංකාර වදන් වලට ප්‍රිය කිරීම, අයහපත් නින්දා සහගත වදන් පිළිකුල් කිරීම යනාදිය එතුමාගේ උතුම් සදාචාර අතරින් විය.

තවද මෙම හදීසයේ නබි තුමාගේ ආචාර විධි අතරින් එක් ආචාර විධියක් පිළිබඳ කරුණු පැමිණ ඇත. එනම් එතුමාට යම් ආහාරයක් ඉදිරිපත් කෙරුණු අවස්ථාවක කිසි විටෙකත් ඒ ආහාරයේ අඩුපාඩු නොකීහ. මෙය සීතල ආහාරයකි, නැතහොත් මෙය නරක ආහාරයකි, මෙය නොඉදුණු වර්ගයකි, මෙය හොඳ නැති ආහාර වර්ගයකි, එසේත් නැතිනම් මෙහි ලුණු අඩු ය හෝ වෙනත් ආකාරයේ අපවාද නබිතුමාණන් පවසන්නේ නැත. එතුමාණන්ට අනුභව කිරීමට කැමති නම් සහ එය එතුමාණන්ට අවශ්‍ය නම් එතුමාණෝ එය අනුභව කරති. එයට අකැමති නම් එය අත්හැර දමා එයට දොස් නොකියති. එය එතුමාණන්ගේ පුරුද්ද සහ ක්‍රමය විය.

එබැවින් අප සැම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ

ආදර්ශය අනුගමනය කළ යුතුය. අපි කිසිවිටෙක ආහාර විවේචනය නොකර සිටිමු. ඒ වෙනුවට අපි දෙවිඳාණන්ගේ ආශීර්වාදවලට ප්‍රශංසා කර ඔහුට ස්තුති කර හොඳ වචන පමණක් කතා කරමු.



# 36

**අල් බරා බින් ආසිබ් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ජනයා අතරින් මුහුණින් වඩාත් අලංකාර අයකු වූහ. දේහ ලක්ෂණවලින් ද ඉතා අලංකාර අයකු වූහ. වඩාත් උසත් නොවන, මිටිත් නොවන අයකු වූහ." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මිනිසුන් අතරින් උතුම් ගතිගුණවලින් හෙබි අයකු වූහ. ඒ ගැන දෙවිඳාණන් මෙසේ පවසයි: "තවද නියත වශයෙන්ම නුඹ අති උතුම් ගතිගුණ මත වන්නෙහිය." (අල් කලම්: 04)

එතුමාණන් ගතිගුණ වලින් උතුම් පමණක් නොව දේහ ලක්ෂණ වලින් ද උතුම් හා අලංකාරය. ශ්‍රේෂ්ඨ සගයකු වන අල්-බරා බින් ආසිබ්, "නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ජනයා අතරින් මුහුණින් වඩාත් අලංකාර, දේහ ලක්ෂණවලින් ඉතා අලංකාර අයකු වූහ." යැයි පැවසුවේ මේ සම්බන්ධයෙනි.

එතුමාණන්ගේ උස සාමාන්‍ය උසකි. එතුමාණන් අධික ලෙස උස් අයකු නොවූ අතර මිටි ද නොවූහ.

තවත් වාර්තාවක: අල්-බරා බින් ආසිබ්තුමා විසින් මෙසේ වාර්තා වී ඇත: "එතුමාණන් මධ්‍යයම උස ඇති තැනැත්තෙකි. එතුමාණන්ගේ උරහිස්

පුළුල් ය. එතුමාගේ හිසකෙස් කන් පෙත්තට ළඟා වන තරමට විය. මම එතුමාව රතු පැහැති ඇඳුමකින් දුටුවෙමි. එතුමාට වඩා අලංකාර කෙනෙකු මා දැක නැත." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

බුහාරි සහ මුස්ලිම් හි අනස් (රළියල්ලාහු අන්හු) තුමා පැවසූ බව මෙසේ වාර්තා වේ: "දෙවිඳාණන්ගේ දූතයාණන් වඩාත්ම වර්ණවත් අයකු විය." එනම් රතු මිශ්‍ර සුදු පැහැයෙන් යුක්ත විය.

අබූහුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පැවසීය: "දෙවිඳාණන්ගේ දූතයාණන් රිදියෙන් සාදා නිම කරන ලද දෙයක් මෙන් සුදු පැහැයෙන් යුක්ත අයකු විය." (මූලාශ්‍රය: තිර්මිදි)

ජාබිර් බින් සමුරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "සඳ එළිය ඇති දීප්තිමත් රාත්‍රියක මා නබිතුමාණන් ව දුටුවෙමි. - මා එතුමා දෙසත් සඳ දෙසත් බැලුවෙමි. සැබැවින් ම එතුමාණන් මට සඳට වඩා අලංකාර ව පෙණිනි." (මූලාශ්‍රය: තිර්මිදි)

# 37

**අම්ර් බින් අල්ආස් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "මිනිසුන් අතරින් ඔබට වඩාත් ආදරණනීය අය කවුරුන් ද? යැයි මම නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් විමසුවෙමි. එතුමාණෝ: "ආඉෂා" යැයි පිළිතුරු දුන්හ. පසුව "පිරිමින් අතරින් කවුරුන් ද? යැයි මම විමසුවෙමි. එතුමාණෝ: "ඇයගේ පියා" යැයි පිළිතුරු දුන්හ. ඉන් පසු කවුරුන්ද? යැයි විමසුවෙමි. එතුමාණෝ "උමර් බින් අල්-හත්තාබ්" යැයි පිළිතුරු දුන්හ." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)**

## විවරණය

අම්ර් ඉබ්න් අල්-ආස් (රළියල්ලාහු අන්හු) තුමා නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ ශ්‍රේෂ්ඨතම සහ ප්‍රසිද්ධ සහගාමියෙකි.

එතුමා නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් තමාට වඩාත්ම ආදරණීය මිනිසුන් ගැන විමසූ විට එතුමාට වඩාත්ම ආදරණීය අය වූයේ සිය බිරිඳ වන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය වේ යැයි එතුමාණෝ පැවසූහ.

ඉන් පසු අම්ර් තුමා: පිරිමි අයගෙන් ඔබට වඩාත්ම ආදරණීය අය කවුරු ද? යනුවෙන් විමසා සිටියේය. ඇගේ පියා යැයි පැවසූහ. එනම් ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගේ පියා වන අබූ බකර් අස්-සිද්දීක් (රළියල්ලාහු අන්හු) තුමාය.

පසුව: ඉන් පසු වඩාත් ම ආදරණීය අය කවුරු ද? යනුවෙන් අම්ර් තුමා විමසා සිටියේය. උමර් බින් අල්-හත්තාබ් යනුවෙන් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූහ.

එතුමාගේ භාර්යාව වන ආඉෂා (රළියල්ලාහු අන්හා), අබූ බක්ර් සහ උමර් (රළියල්ලාහු අන්හුමා) යන සහාබාවරුන් තිදෙනාට මෙය අති විශාල ගෞරවයකි.

**දැනගත යුතු කරුණ වන්නේ:** පාලකයින් (කුලෆාවරුන්) හතර දෙනා විශිෂ්ට සහාබාවරුන් වෙති. ඔවුන්ගේ විශිෂ්ටත්වයේ අනුපිළිවෙල කිලාෆත් නැමති නියෝජනයෙහි ඔවුන්ගේ අනුපිළිවෙලට සමාන වේ. ඔවුන්ගෙන් අති විශිෂ්ට වනුයේ අබූ බක්ර් ය. පසුව උමර් ය. පසුව උස්මාන් ය. පසුව අලී ය. (ඔවුන් සියල්ලන්ටම අල්ලාහ්ගේ තෘප්තිය ලැබේවා!) මෙය අහ්සලුස් සුන්නාහ් වල් ජමාආ වරුන්ගේ ඒකමතික මතය වේ.

පොදුවේ ගත් කළ මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාගේ සමූහයෙහි ඉතා ශ්‍රේෂ්ඨ අය මොවුන් වෙති. ඔවුන් කෙරෙහි සහ අනෙකුත් සහාබාවරුන් කෙරෙහි අපගේ යුතුකම වන්නේ ඔවුන්ට ආදරය කිරීම, ඔවුන්ට ගරු කිරීම, ඔවුන් පිළිබඳ තෘප්තියට පත් වීම වේ.

# 38

අනස් බින් මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් අධික ලෙස ප්‍රර්ථනා කළ ප්‍රර්ථනා පෙළ මෙය විය. "අල්ලාහුම්ම ආතිනා ෆිද්දුන්යා හසනතන් වෆිල් ආහිරති හසනතන් වකිනා අදාබන්නාර්" (අහෝ දෙවිඳාණනි! මෙලොව යහපතත් මතුලොව යහපතත් අපට පිරිනමනු මැනව. අපා ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව.)" (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

## විවරණය

අල්ලාහ්ගෙන් (දූආ) අයැදීම ශ්‍රේෂ්ඨතම දැහැමි ක්‍රියාවන්ගෙන් එකකි. එය ඔහු ව මහිමයට පත් කිරීම හා ඔහුගේ ඒකීයත්වය තහවුරු කිරීම පිළිබඳ සාක්ෂියකි. එමෙන් ම ඔහුගේ දයාව, සමාව සහ තෘප්තිය, ඔහුගේ ආදරය, පිළිගැනීම සහ ආශීර්වාදය සඳහා හේතුවක් වේ.

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ අධික ලෙස අල්ලාහ්ගෙන් (දූආ) අයැද සිටින්නෙකු වූහ. එතුමාගේ අයැදීම් සහීහ් අල්-බුහාරි, සහීහ් මුස්ලිම්, සුනන් අල්-තිර්මිදි, සුනන් අබී දාවූද්, සුනන් අල්-නසාඊ සහ සුනන් ඉබ්නු මාජාහ් වැනි හදීස් ග්‍රන්ථ සයෙහි හා වෙනත් ග්‍රන්ථ වල වාර්තා වී ඇත.

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ අයැදීම් බොහෝ වුව ද එතුමාණෝ මෙම අයැදීම අධික ලෙස කළහ. මන්ද එය මෙලොව සහ පරලොව යහපත ඇතුළුව අල්-කුර්ආනයේ සඳහන් උතුම් අයැදීමක් වන බැවිනි. "(අල්ලාහුම්ම ආතිනා ෆිද්දුන්යා හසනතන් වෆිල් ආහිරති හසනතන් වකිනා අදාබන්නාර්)" එහි අර්ථය: (අහෝ දෙවිඳාණනි!

මෙලොව යහපතත් මතුලොව යහපතත් අපට පිරිනමනු මැනව. අපා ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව.)

**ෂෙයික් අබ්දුර් රහ්මාන් අස් සඅදී (රහිමහුල්ලාහ්)තුමා මෙසේ පැවසීය**: මෙලොව යහපත තුළ: හලාල් නම් දැහැමි අනුමත පෝෂණය, දැහැමි භාර්යාව, ඇස් පිනවන දරුවන්, සැනසීම සහ සතුට, ප්‍රයෝජන වත් දැනුම, ධාර්මික ක්‍රියාවන් යනාදී ප්‍රියමනාප කරුණු සියල්ලක් ම ඇතුළත් වේ.

පරලොව යහපත වනාහි: මිනීවළේ, මතු ලොවේ රැස් වන ස්ථානයේ සහ අපායේ දඬුවම්වලින් ආරක්ෂා වීම, දෙවිඳාණන්ගේ තෘප්තිය ලබා ගැනීම, සදාකාලික සතුට දිනා ගැනීම සහ දයාවන්ත ස්වාමියාණන් වන අල්ලාහ්ට සමීප වීම යනාදී කරුණු ය.

එහෙයින් මෙම අයැදීම සම්පූර්ණ අයැදීමකි. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ ඒ අයුරින් අධික ලෙස අයැද සිටියේ ද ඒ පිළිබඳ අන් අය දිරිගැන්වූයේ ද එබැවිනි.

# 39

**නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "මිනිසා මිය ගිය විට, කරුණු තුනක් හැර අන් සියල්ල විසන්ධි වී යනු ඇත. අඛණ්ඩ පුණ්‍යාදාරය, ප්‍රයෝජන වත් දැනුම, ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරන දැහැමි දරුවෙක්."** (මූලාශ්‍රය: මුස්ලිම්)

## විවරණය

සර්වබලධාරී දෙවිඳාණන් තම විශ්වාසවන්ත ගැත්තන්ට, ඔවුන්ව ඔහුගේ දයාවට සමීප කරවන, ඔහුගේ උදහසින් හා දඬුවමින් ඔවුන් ගලවා ගන්නා ධර්මිෂ්ඨ ක්‍රියාවන් සිදු කරන ලෙස නියෝග කර ඇත.

කවරෙකු හෝ මිය යන්නේ නම් කරුණු තුනක් හැර අන් සියල්ල ඔහුගෙන් විසන්ධි වී යන බවත් ඒ කරුණු තුන ඔහු මිය ගිය පසුවත් ඔහුට චේතනය ලබා දෙන කාරණා බවත් මෙම හදීසයෙන් නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ අපට පෙන්වා දුන්හ.

**පළමු කරුණ:** ඔහුගේ ජීවිත කාලය තුළ (සදකා ජාරියා නොහොත්) අඛණ්ඩ පුණ්‍ය කර්මයක් සිදු කර තිබීම; උදාහරණයක් ලෙස: ජීවත්ව සිටියදී කෙනෙකු ළිඳක් හාරා එය පරිත්‍යාග කළේ නම් එමගින් ඔහුගේ මරණයෙන් පසුවද එහි චේතනය ඔහුට ලැබෙනු ඇත. එනම් කවරෙකු හෝ එම ළිඳෙන් ප්‍රතිලාභයක් ලබන විට, ළිඳ සාදා දුන් එම තැනැත්තාට එහි චේතනය ඔහු මිනීවළ තුළ සිටිය දී පවා ලැබෙනු ඇත.

මේ හා සමාන කටයුතු වනාහි .දේවස්ථාන, රෝහල් සහ පාසල් ඉදි කර දීම, අල් කුර්ආන් පිටපත් පරිත්‍යාග කිරීම සහ අනෙකුත් අඛණ්ඩ පුණ්‍යාදාර කටයුතු වේ.

**දෙවැනි කරුණ**: ප්‍රයෝජනවත් දැනුම, යමෙක් මිනිසුන්ට උගන්වන්නේ ද, ඔවුන්ට අනුශාසනා කරන්නේ ද, ඔවුන්ට මඟ පෙන්වන්නේ ද, පොතක් ලියයි ද, ප්‍රයෝජනවත් දැනුම මුද්‍රණය කොට බෙදා හැර ප්‍රකාශනය කිරීම වෙනුවෙන් සහයෝගය දක්වන්නේ ද එහි චේතනය ඔහුගේ ජීවිත කාලය තුළත් ඔහුගේ මරණයට පසුවත් ඔහුට ලැබෙනු ඇත.

**තුන්වන කරුණ:** දැහැමි දරුවන්: (දරුවන් යන වචනයට පිරිමි දරුවන් මෙන් ම ගැහැණු දරුවන් ද ඇතුළත් වේ) එබැවින් පිරිමියෙකු හෝ කාන්තාවකු හෝ වේවා තම දරුවන් දැහැමි ලෙස ඇති දැඩි කරන්නේ නම් ඒ දරුවන් සිදු කරන සෑම දැහැමි ක්‍රියාවක ම චේතනය ඔවුන් ව ඇති දැඩි කළ අයගේ තුලාවෙහි ද පවතිනු ඇත. මන්ද දැහැමි දරුවකු තම දෙමාපියන් වෙනුවෙන් අයැද සිටී. එබැවින් ඔවුන්ගේ චේතනය අල්ලාහ් අබියස අඛණ්ඩව පැවතීමේ තත්ත්වයක් උදා වේ.



# 40

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව ජාබිර් බින් අබ්දුල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: "සෑම ගැත්තෙකු ම ඔහු කුමන පදනමක් මත මරණයට පත් වූයේ ද ඒ මත ම නැවත නැගිටුවනු ලබනු ඇත." (මූලාශ්‍රය: මුස්ලිම්)**

## විවරණය

මෙම හදීසය යහපත් අවසානයක් ගැන කථා කරයි. එය නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ සහගාමීන්ගෙන් පටන් අද දක්වාම යහපත් හා දැහැමි දනන් සැලකිලිමත් වන ශ්‍රේෂ්ඨමත් කරුණකි.

යහපත් අවසානය යන්නෙහි අරුත නම් පුද්ගලයෙකු ඔහු දේවත්වය විශ්වාස කරමින් යහපත්කමෙහි සහ දැහැමි ක්‍රියාවන්හි නිරත වෙමින් සිටින අතරතුර ඔහුගේ ජීවිතයේ අවසානය නොහොත් මරණය සිදු වීම වේ.

පුද්ගලයෙකු යම් තත්ත්වයක මිය ගියහොත්, එම තත්ත්වය තුළ නැවත නැඟිටුවීමේ දිනයේ ඔහු නැවත නැඟිටුවනු ලබන බව මෙම හදීසයේ නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ අපට පෙන්වා දුන්හ. හජ් හෝ උම්රා හි තල්බියා පවසන විට මිය යන්නේ නම් එය පවසමින් ම ඔහු නැවත නැඟිටුවනු ලැබේ. එමෙන් ම කවරෙකු අල්ලාහ් ව මෙනෙහි කරමින් සිටිය දී මිය යන්නේ ද ඔහු ඒ අයුරින් ම නැඟිටුවනු ලැබේ. එමෙන් ම කවරෙකු පවක් කරමින් සිටිය දී මිය යන්නේ ද ඔහු ඒ පවත් සමඟ ම

නැවත නැඟිටුවනු ලබයි. අල්ලාහ් අප සැම ආරක්ෂා කරත්වා!

එබැවින් යහපත් අවසානයකින් අපගේ අවසානය සිදුවීම සඳහාත්, දෙවිඳාණන්ගේ දයාව, සමාව සහ ප්‍රසාදය තුළ අප සිටින අතරතුර නැවත නැඟිටුවනු ලැබීමටත් අකුසල් කර්මවලින් වැළකී සිට, යහපත් කටයුතු තුළින් කාලය පුරවා ගැනීමට අප කල්පනාකාරී විය යුතුයි.

# නබි වදන් හතළිහ අනුපිළිවලින්

1- عن عبدِ اللهِ بنِ عُمَرَ بنِ الخطَّابِ ﵄ قال: قال رسول الله ﷺ:
**«بُني الإِسلامُ على خمسٍ: شهادةِ أن لّا إِلٰهَ إلّا اللهُ، وأنَّ محمَّدًا رسولُ اللهِ، وإقامِ الصلاةِ، وإِيتاءِ الزَّكاةِ، والحجِّ، وصومِ رمضانَ»**.
متفق عليه

2- عن أنسِ بن مالكٍ ﵁ قال: سُئِل النبيُّ ﷺعن الكبائر، فقال:
**«الإِشْرَاكُ باللهِ، وعُقُوقُ الوالِدَينِ، وقتلُ النَّفْسِ، وشهادةُ الزُّورِ»**.
متفق عليه

3- عن عبد الله بن عمرو ﵄ قال: قال رسول الله ﷺ: **«المُسلِمُ: مَن سَلِمَ المُسْلِمونَ مِن لسانِه ويَدِه»**. متفق عليه

4- عن أبي هريرة ﵁ قال: قال رسول الله ﷺ: **«آيةُ المُنافقِ ثلاثٌ: إذا حدَّثَ كَذَبَ، وإذا وعَدَ أَخْلَفَ، وإذا اؤْتُمِنَ خانَ»**. متفق عليه

5- عن جابر بن عبد الله ﵄، قال: قال رسول الله ﷺ: **«بين الرجُلِ وبين الشِّركِ والكفرِ ترْكُ الصَّلاةِ»**. رواه مسلم

6- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: **«المؤمنُ القويُّ خيرٌ وأحبُّ إلى الله من المؤمنِ الضعيف، وفي كُلٍّ خير»**. رواه مسلم

7-عن عثمانَ بنِ عفَّانَ ﵁، قال: قال رسول الله ﷺ: **«من توضَّأَ لِلصَّلاةِ فأَسْبَغَ الوُضوءَ، ثُمَّ مشى إلى الصَّلاةِ المكتُوبةِ فصَلَّاها مع الجماعةِ، غفَرَ اللهُ له ذنوبَه»**. رواه مسلم

8- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: **«من كذَبَ عليَّ مُتعمِّدًا فلْيَتبَوَّأْ مقعَدَهُ من النَّار»**. متفق عليه

9- عن عبد الله بن مسعود ﵁، قال: قال رسول الله ﷺ: **«لا يدخلُ الجنَّةَ مَن كان في قلبه مِثقالُ ذَرَّةٍ مِن كِبْرٍ»**. رواه مسلم

10- عن عثمانَ بنِ عفَّانَ رضي الله عنه، قال: قال رسول الله ﷺ: «**خيرُكم مَن تعلَّمَ القُرْآنَ وعلَّمَه**». رواه البخاري

11- عن أبي هريرة رضي الله عنه، قال: قال رسول الله ﷺ: «**كلمتانِ خفيفتانِ على اللسان، ثقيلتانِ في الميزان، حبيبتانِ إلى الرحمن: سبحانَ اللهِ وبِحَمْده، سبحانَ اللهِ العظيم**». متفق عليه

12- عن أبي هريرة رضي الله عنه، قال: «**أَوصاني خليلي ﷺ بِثلاثٍ: صيامِ ثلاثة أيَّامٍ مِن كُلِّ شَهرٍ، ورَكْعتي الضُّحَى، وأَن أُوتِرَ قبل أن أنام**». متفق عليه

13- عن أبي هريرة رضي الله عنه، قال: قال رسول الله ﷺ: «**أَقرَبُ ما يكونُ العبدُ مِن ربِّه وهو ساجِدٌ، فأَكْثِرُوا الدُّعاءَ**». رواه مسلم

14- عن ثابت بن الضَّحَّاكِ رضي الله عنه، قال: قال رسول الله ﷺ: «**لَعْنُ المُؤْمِنِ كَقَتْلِه**». متَّفقٌ عليه

15- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: **«قال اللهُ تبارك وتعالَى: يا ابْنَ آدمَ، أَنْفِقْ أُنْفِقْ عليك»**. متفق عليه

16- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: **«ما يُصيبُ المُسلِمَ مِن نَصَبٍ ولا وَصَبٍ، وَلا هَمٍّ وَلَا حَزَنٍ، ولا أَذًى ولا غَمٍّ، حتَّى الشَّوْكَة يُشاكُها، إلَّا كَفَّرَ اللهُ بها مِن خَطاياه»**. متفق عليه

17- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: **«لا تَدخلُونَ الجنَّةَ حتى تُؤْمِنُوا، ولا تُؤمِنُوا حتَّى تَحابُّوا، أَوَلا أَدُلُّكُم على شَيءٍ إذا فَعَلتُمُوهُ تَحابَبْتُم؟ أفْشُوا السَّلامَ بينكم»**. رواه مسلم

18- عن أبي سعيدٍ الخُدْري ﵁، قال: قال رسول الله ﷺ: **«لا يَنظُرُ الرَّجلُ إلى عَورَةِ الرَّجُلِ، ولا المَرأَةُ إلى عَورَةِ المَرأَةِ»**. رواه مسلم

19- عن الصَّعْبِ بنِ جَثَّامَةَ ﵁: أنه أَهْدَى إلى رسول الله ﷺ صيدًا، فردَّه النبي ﷺ عليه ولم يَقْبَلْه منه، فلمَّا رأى النبيُّ ﷺ ما في وجهه من الحُزْن، قال: **«إِنَّا لم نَرُدَّهُ عليك إلَّا أَنَّا حُرُمٌ»**. متفق عليه

20- عن حذيفة بن اليَمَانِ ﵁، قال: قال رسول الله ﷺ: **«لا يدخلُ الجنَّةَ قتَّاتٌ»**. متفق عليه

21- عن أنس بن مالك ﵁، قال: قال رسول الله ﷺ: **«ما مِن مُسلمٍ يَغرِسُ غَرْسًا، أو يَزْرَعُ زرعًا، فيأكل منه طيرٌ أو إنسانٌ أو بهيمةٌ، إلَّا كان له به صدقة»**. متفق عليه

22- عن أبي هريرةَ ﵁، قال: كان لرجلٍ على رسول الله ﷺ دَيْن، فجاء يتقاضاه وأَغْلَظ، فَهَمَّ به أصحابُ النبيّ ﷺ: فقال النبيُّ ﷺ: **«دَعُوهُ؛ فإنَّ لِصاحبِ الحَقِّ مَقَالًا»**. متفق عليه

23- عن أبي قتادةَ ﵁، قال: قال رسول الله ﷺ: **«مَن سَرَّهُ أن يُنْجِيَهُ اللهُ مِن كُرَبِ يومِ القيامة، فَلْيُنَفِّسْ عن مُعْسِرٍ، أو يَضَعْ عَنه»**. رواه مسلم

24- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: **«مَن غَشَّنا فلَيس مِنَّا»**. رواه مسلم

25- عن أبي أُمَامَةَ ﵁، قال: قال رسول الله ﷺ: «**مَن اقتَطَعَ حَقَّ امْرِئٍ مُسلِمٍ بِيَمِينِه، فقد أَوجَبَ اللهُ له النَّارَ، وحَرَّمَ عليه الجَنَّة**»، فقال رجل: يا رسولَ الله، وإن كان شيئًا يسيرًا؟ قال: «**وإِنْ قَضِيبًا مِن أَرَاكٍ**». رواه مسلم

26- عن أبي موسى الأشعريّ ﵁، أنَّ النبيَّ ﷺ بَعَثَهُ ومعاذًا إلى اليَمَن، وقال لهما: «**يَسِّرَا ولا تُعَسِّرَا، وبَشِّرَا ولا تُنَفِّرَا، وتَطَاوَعَا ولا تَختَلِفَا**». متفق عليه

27- عن أبي موسى الأشعريّ ﵁، قال: قال رسول الله ﷺ: «**من حَمَلَ عَلَينا السِّلاحَ فَلَيسَ مِنَّا**». متفق عليه

28- عن عبد الله بن مُغَفَّلٍ ﵁، أنَّ رسول الله ﷺ نَهى عن الخَذْفِ، وقال: «**إنَّها لا تَصِيدُ صَيدًا، ولا تَنْكَأُ عَدُوًّا، ولكِنَّهَا تَكسِرُ السِّنَّ، وَتَفْقَأُ العَيْنَ**». متفق عليه

29- عن أنس بن مالك ﵁، قال: «**خَدَمْتُ النَّبِيَّ ﷺ عَشْرَ سِنِينَ، فما قال لِي أُفٍّ قَطُّ**». متفق عليه

30- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: «**إذا قامَ أَحَدُكم مِن مَجْلِسِه ثُمَّ رجع إليه، فَهُوَ أَحَقُّ بِه**». رواه مسلم

31- عن أبي هريرةَ ﵁، قال: قال رسول الله ﷺ: «**حقُّ المُسلمِ على المُسلم سِتٌّ: إذا لَقِيتَهُ فَسَلِّمْ عليه، وإذا دعاك فأجِبْهُ، وإذا اسْتَنْصَحَكَ فَانْصَحْ لَهُ، وَإِذَا عَطَسَ فَحَمِدَ اللهَ فَشَمِّتْهُ، وإذا مَرِضَ فَعُدْهُ، وإذا ماتَ فَاتبَعْه**».

32- عن أبي سعيد الخدري ﵁، قال: قال رسول الله ﷺ: «**أَعْطُوا الطَّرِيقَ حَقَّهُ**»، قالوا: وما حقُّه؟ قال: «**غَضُّ البَصَرِ، وَكَفُّ الْأَذَى، ورَدُّ السَّلامِ، وَالأَمْرُ بِالمَعرُوفِ وَالنَّهيُ عَنِ المُنكَر**». متفق عليه

33- عن عبد الله بن عُمَرَ رضي الله عنه، قال: قال رسول الله ﷺ: **«ما حَقُّ امرِئٍ مُسلِمٍ لَهُ شَيءٌ يُوصِي فِيه، يَبِيتُ لَيلَتَينِ إِلَّا وَوَصِيَّتُهُ مَكتُوبَةٌ عِندَه»**. متفق عليه

34- عن عبد الله بن عُمَرَ رضي الله عنهما، قال: قال رسول الله ﷺ: **«إِنَّ اللهَ يَنهاكُم أَن تَحْلِفُوا بِآبَائِكُم، مَن كان حَالِفًا فَلْيَحْلِفْ بِاللهِ أَوْ لِيَصْمُتْ»**. متّفقٌ عليه

35- عن أبي هريرةَ رضي الله عنه قال: **«مَا عَابَ النَّبِيُّ ﷺ طعامًا قَطُّ، إِنِ اشْتَهاهُ أَكَلَهُ، وَإِلَّا تَرَكَهُ»**. متفق عليه

36- عن البراء بن عازبٍ رضي الله عنه، قال: **«كَانَ رَسُولُ اللهِ ﷺ أَحسَنَ النَّاسِ وَجْهًا، وَأَحْسَنَهُمْ خَلْقًا، لَيسَ بِالطَّوِيلِ الْبَائِنِ، وَلَا بِالْقَصِيرِ»**. متفق عليه

37- عن عَمْرو بن العاص ﵁، قال: سألتُ النبيَّ ﷺ: أيُّ الناس أَحَبُّ إليك؟ قال: **«عَائِشَةُ»**، فقلتُ: مِنَ الرجال؟ قال: **«أَبُوهَا»**، قلت: ثُمَّ مَنْ؟ قال: **«ثُمَّ عُمَرُ بنُ الخطَّاب»**. متفق عليه

38- عن أنس بن مالكٍ ﵁، قال: كان أكثر دعاء النبيُّ ﷺ: **«اللَّهُمَّ آتِنَا في الدُّنيا حَسَنَةً وفي الآخِرَةِ حَسَنَةً، وَقِنَا عذابَ النَّارِ»**. متفق عليه

39- عن أبي هريرة ﵁، قال: قال رسول الله ﷺ: **«إذا ماتَ الإنسانُ انقَطَعَ عَمَلُهُ إلَّا مِن ثلاثةٍ: إلَّا مِن صدقةٍ جاريةٍ، أو عِلمٍ يُنْتَفَعُ به، أو ولدٍ صالِحٍ يَدْعُو له»**. رواه مسلم

40- عن جابر بن عبد الله ﵁، قال: قال رسول الله ﷺ: **«يُبْعَثُ كُلُّ عَبدٍ على ما ماتَ عليه»**. رواه مسلم

# පටුන


හදීස් 1: ඉස්ලාම් දහම කරුණු පහක් මත පිහිටා ඇත......

හදීස් 2: අල්ලාහ්ට ආදේශ තැබීම, දෙමාපියන්ට අකීකරු වීම......

හදීස් 3: (සැබෑ) මුස්ලිම්වරයකු වනාහි කවරෙකුගේ..........

හදීස් 4: කුහකයකුගේ සලකුනු තුනකි……

හදීස් 5: පුද්ගලයෙකු අතරත් දේවත්වයට ආදේශ කිරීම සහ.....

හදීස් 6: දේවත්වය විශ්වාස කරන ශක්තිමත් අයකු,......

හදීස් 7: කවරෙකු සලාතය සඳහා පරිපූර්ණ ලෙස වුළු.....

හදීස් 8: කවරෙකු මා කෙරෙහි ඕනෑකමින් බොරු ගොතා.......

හදීස් 9: කවරෙකුගේ සිත තුළ  අණුවක තරම්......

හදීස් 10: “ඔබ අතරින් ශ්‍රේෂ්ඨ වනුයේ.....

හදීස් 11: වදන් දෙකක් ඇත. ඒ දෙක දිවට ඉතා පහසුය....

හදීස් 12: සෑම මසකම දින තුනක උපවාසය....

හදීස් 13: ගැත්තෙකු තම පරමාධිපතියාණන්ට ඉතා සමීප වන්නේ...

හදීස් 14: දේවත්වය විශ්වාස කරන අයෙකුට ශාප කිරීම.........

හදීස් 15: උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කළේය......

හදීස් 16: මුස්ලිම්වරයකුට යම් වෙහෙසක් හෝ රෝගයක් හෝ......

හදීස් 17: ඔබ දේවත්වය විශ්වාස කරන තෙක්.........

හදීස් 18: පිරිමියකු තවත් පිරිමියකුගේ රහසඟ.....

හදීස් 19: දඬයම් කළ සතෙකු ප්‍රදානය කළේය...

හදීස් 20: ඕපාදූප කියමින් සැරිසරන අයකු........

හදීස් 21:  කවර හෝ මුස්ලිම්වරයකු යම් ගසක් සිටුවන්නේ ද.....

හදීස් 22: අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) පුද්ගලයකුට ණය වී සිටියහ..........

හදීස් 23: කවරෙකු මතුලොව පීඩාවන්ගෙන් අල්ලාහ් ඔහුව මුදවා ගනු ඇතැයි අපේක්ෂා කරන්නේ ද.......

හදීස් 24: “කවරෙකු අපට වංචා කළේ ද ඔහු......

හදීස් 25: කවරෙකු තවත් මුස්ලිවරයකුගේ උරුමයක්.......

හදීස් 26: සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ එතුමා ව සහ මුආද් (රළියල්ලාහු අන්හු) තුමාව යෙමනය වෙත යවා තබන අවස්ථාවෙහි.................

හදීස් 27: කවරෙකු අපට එරෙහිව ආයුධයක් ඔසවන්නේ ද...........

හදීස් 28: සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) අතින් ගල් කැට විසි කිරීම තහනම් කළහ..........

හදීස් 29: “නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ට වසර දහයක් මම සේවය කර ඇත්තෙමි...........

හදීස් 30: “ඔබෙන් කවරෙකු හෝ ඔහු අසුන්ගත් තැනින් නැගිට ඒ වෙත නැවත පැමිණියේ නම්..........

හදීස් 31: මුස්ලිම්වරයකු මත පැවරෙන තවත් මුස්ලිම්වරයකු සඳහා වූ යුතුකම් හයකි......

හදීස් 32: මාර්ගයට එහි අයිතිය ලබා දෙන්න........

හදීස් 33: අන්තිම කැමැත්ත ප්‍රකාශ කිරීමට යම්.........

හදීස් 34: ඔබ ඔබේ දෙමව්පියන්ගේ නාමයෙන් දිවුරා සිටීම.......

හදීස් 35: නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ කිසිදු ආහාරයකට අඩුපාඩු නොකීහ............

හදීස් 36: අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ජනයා අතරින් මුහුණින් වඩාත් අලංකාර අයකු වූහ....

හදීස් 37: මිනිසුන් අතරින් ඔබට වඩාත් ආදරණීය අය කවුරුන් ද? ...

හදීස් 38: නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් අධික ලෙස ප්‍රර්ථනා කළ ප්‍රර්ථනා පෙළ......

හදීස් 39: මිනිසා මිය ගිය විට, කරුණු තුනක් හැර අන් සියල්ල විසන්ධි වී යනු ඇත. ......

හදීස් 40: සෑම ගැත්තෙකු ම ඔහු කුමන පදනමක් මත මරණයට පත් වූයේ ද ඒ මත ම....................

සිංහල

- මෙම කෘතිය දරුවන් සඳහා සුදුසු වන සේම වැඩිහිටියන්ටත් සුදුසුයි. මෙම කෘතියෙහි අල් කුර්ආන් වැකි, නබි වදන් සහ විද්වතුන්ගේ පොත් වල සඳහන් මාර්ගෝපදේශ -එහි මුල් ප්‍රකාශ සමඟ හෝ එහි අර්ථය හෝ ගෙන හැර දැක්වීම-  මිස වෙනකක් අන්තර්ගත වී නැත.

- මෙම කෙටි නබි වදන් මා විසින් තෝරා ගැනීමට හේතුවූයේ ඒවා පාඩම් කිරීමේ දී පහසු වන බැවිණි. එමෙන්ම විවිධ මාතෘකාවන් යටතේ ඒවා සඳහන් කර ඇත්තේ උපරිම අයුරින් ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ය.

- පාඩම් කිරීමට සහ නැවත ආවර්ජනය කිරීමට පහසු වන අන්දමින් නබි වදන් හතළිහ ම මෙම කෘතිය අවසානයේ දී මා විසින් පිළිවලට ගෙන එන ලදී.

- කුඩා දූ දරුවන් පාඩම් කිරීම සඳහා මෙම නබි වදන් හතළිහ මා සම්පාදනය කළෙමි. එබැවින් නිවෙස්, පාසැල්, දේවස්ථාන හා වෙනත් උචිත ස්ථාන වල මෙම නබි වදන් පාඩම් කිරීමේ තරඟ හා වැඩසටහන් පවත්වන ලෙස මා උපදෙස් දෙමි.

- මෙම නබි වදන් පාඩම් කිරීමේ දී දරුවන්ට ලෙහෙසි වීමටත් එයින් උපුටා ගත් ප්‍රයෝජනවත් ඉස්ලාමීය කරුණු ඔවුනට උගන්වීමටත් දෙමාපියන් හා ගුරුවරුන් විසින් ඔවුනට එය ප්‍රථමයෙන් කියවා පෙන්වන ලෙස ඉල්ලා සිටිමි.

- එම නබි වදන් විග්‍රහ කිරිමේ දී බෝහෝ අර්ථ දැක්වීම්, උපුටාගැනීම් හා මාර්ගෝපදේශ රාශියක් ඉදිරිපත් කර ඇත්තෙමි. එහෙත් මා මෙහි ඉදිරිපත් කළ කරුණු වලට වඩා බොහෝ කරුණු ඉන් බාහිර ව දක්නට ලැබේ. එබැවින් තනිවම හෝ වෙනත් කෙනෙකුගේ සහය ඇතිව හෝ මෙම නබි වදන් පිළිබඳ කරුණු සොයා බලා ඒවායින් ප්‍රයෝජන ලබා ගෙන අන් අයටත් ඒ ප්‍රයෝජනය ලබා දීම සඳහා ඒවා විශ්ලේශණය කර බලන මෙන්  මා දූ දරුවන්ගෙන් ඉල්ලා සිටිමි.

මුහම්මද් බින් සුලයිමාන් අල් මුහන්නා



مركز أصول
Osoul Center
www.osoulcenter.com